# හින්දි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 12 වැනි ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය :www.nie.lk

විද්‍යුත් තැපෑල :info@nie.lk

හින්දී භාෂාව

ගුරු මාර්ගෝපදේශය

12 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කිකකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කිකකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම යන කාර්ය සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසනු ලැබ ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතාවලින් හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයන්ගේ හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද සුභාවිතයන් මගින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ හා සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුමය ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම් සාධනය වීම සඳහා අන්තර්ගතය මගින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළපොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළපොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළපොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා, මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සම්බන්ධීකරණය - ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,
සහකාර කථිකාචාර්ය (ශාස්ත්‍රපති)
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සංස්කරණය - මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ,
අධ්‍යයනාංශ ප්‍රධාන (දර්ශනශූරී) හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

ලේඛක මණ්ඩලය - **බාහිර**

01. මාහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න,
පීඨාධිපති (දර්ශනශූරී) මානව ශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය.

02. බ්‍රසිල් නාගොඩවිතාන මයා,
කථිකාචාර්ය (ශාස්ත්‍රපති) භාෂා අධ්‍යයනාංශය,
සබරගමුව විශ්වවිද්‍යාලය.

03. ජයන්තා මනෝරී මිය,
බාහිර කථිකාචාර්ය (ශාස්ත්‍රපති) භාෂා හා සංස්කෘතික
අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

04. ආර්.ජේ.කේ. අනෝමා මිය (පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)
ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය.

05. ඩබ්.එම්. මාධවී ඩී ජයරත්න මිය (පශ්චාද් උපාධි අධ්‍යාපන
ඩිප්ලෝමා, ශාස්ත්‍රපති)
කු/ මලියදේව බාලිකා විද්‍යාලය

.

**අභ්‍යන්තර**

01. ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,
සහකාර කථිකාචාර්ය (ශාස්ත්‍රපති)
ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ පාසල් පද්ධතියට හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂය මාලාව පාසල් අධ්‍යාපනයේ පූර්ණ පරිවර්තනයක් ඇති වන ආකාරයෙන් සැලසුම් කර තිබේ. නිපුණතාවක් යනු දැනුම (Knowledge), කුසලතා (Skills), ආකල්ප (Attitudes), පෞද්ගලික හා සාමාජීය හැකියා (Personal & Social Abilities) යන මේ සංරචකවලින් සමන්විත වූවකි. ඒ අනුව වැඩ කරන හෝ ඉගෙන ගන්නා තත්ත්වයන් දී දැනුම, කුසලතා, ආකල්ප, පෞද්ගලික හා සමාජීය හැකියා යොදාගැනීමට ඇති කුසලතාව නිපුණතාවක් ලෙස හැඳින්විය හැකි ය.

හින්දී විෂය නිර්දේශය ද නිපුණතා පාදක වූවකි. පාසල් සිසුන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතා ද ගොඩ නැඟීමේ අරමුණෙන් පාසල් තුළ හින්දී භාෂාව ඉගැන්වීම කළ යුතු වේ. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය කොට ඇත. එහි දී විෂය භාර ගුරු භවතා විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කොට ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදිය යුතු වේ.

12 ශ්‍රේණිය සඳහා නිපුණතා 10ක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් වේ. එම නිපුණතා මගින් හින්දී භාෂාවේ නිවැරදි උච්චාරණය සහ නිවැරදි ලේඛනය, හින්දී භාෂාව ශ්‍රවණයෙන් අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද හින්දී භාෂාව සරල ව කථා කිරීමේ හැකියාව ද ශිෂ්‍යයා තුළ ඇති කරයි. හින්දී භාෂාව හා සම්බන්ධ ව්‍යාකරණ පිළිබඳ මූලික අවබෝධය ශිෂ්‍යයා තුළ ඇති කරන අතර හින්දී ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගැනීමේ හැකියාව හා පරිවර්තන හැකියාව ද ඇති කරයි. ගුරුවරයාට ඉගැන්වීමේ පහසුව සඳහා ද, ශිෂ්‍යයාට ඉගෙන ගැනීමේ පහසුව සඳහා ද, පරිශීලන ග්‍රන්ථ ආධාර කර ගත හැකි ය. පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද මෙහි දී යොදා ගත යුතු අතර තාක්ෂණික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගැනීම අවශ්‍ය වේ. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හා පාඩම් සැලසුම්කරණයේ දී ඉගෙනුම් පල ගුරුවරයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඉගෙනුම් පල යනු යම් පාඩමක් ඉගෙන ගැනීමෙන් අනතුරු ව සිසුවා සාධනය කර ගනී යැයි අපේක්ෂිත ප්‍රතිඵලය යි. ගුණාත්මක යෙදවුම්, පාඩමේ සංවර්ධනය සඳහා ද ඉගෙනුම් ක්‍රියාවලියේ ඒකාකාරී, නීරස බව ඉවත් කරමින් එහි ප්‍රතිඵලදායක වර්ධනයක් ඇති කිරීම සඳහා ද පිටුවහල් කර ගත හැකි ය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ව සිදු වන්නේ දැයි සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් එයට වන අතර, තක්සේරුව හා ඇගයීම එහිලා ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යෝන්‍ය සබඳතාව ද තහවුරු වේ.

නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැලකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමු කොට අපේක්ෂිත ඉගෙනුම් පල පාඩම අවසානයේ දී ශිෂ්‍යයාගෙන් ප්‍රකට වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතු ය. සෑම නිපුණතා මට්ටමක් සඳහා ම අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ලබා දී ඇති අතර යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුවරයාට මෙහි දී නිදහස හිමි වේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදි නිපුණතාවලට වෙන්කර ඇති කාලච්ඡේද ප්‍රමාණ සංශෝධනය කරගැනීමට ගුරුවරයාට නිදහස ඇත. තක්සේරුව හා ඇගයීම් වැඩපිළිවෙළ, ලබා දී ඇති නිර්ණායක පදනම් කොට ගනිමින් ඒවා

ශිෂ්‍යයාගෙන් ප්‍රකටකොට ගැනීම සඳහා ඉගැන්වීම් කාර්යයේ මුල සිට අග තෙක් ම සිදුකළ හැකි ය. සිසුන්ගේ හැකියා නොහැකියා අනුව ඉදිරි පෝෂණය හා ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායික ව භාවිත කළ දේශන ක්‍රමය පදනම් කරගත් සම්ප්‍රේෂණ ගුරු භූමිකාව වෙනුවට ගවේෂණයේ යෙදීමට සිසුවාට ඉඩ සලසමින් ශිෂ්‍ය විභවතා මතු කර ගැනීමට සමත් පරිණාමන ගුරු භූමිකාවක අවශ්‍යතාව පැන නැගී ඇත. එබැවින් සාම්ප්‍රදායික පන්ති කාමර, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ඔස්සේ සිසුවා වෙත සමීප වීමටත් නවීන තාක්ෂණය ද ප්‍රයෝජනයට ගනිමින් සාර්ථක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයා මඟ පාදා ගත යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදාළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඉගෙනුම් පල අත්පත් කර ගත යුතු අතර, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණාත්මක ව සිදු කර ගත යුතු ය.

**ඒ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,**
**ව්‍යාපෘති නායක.**

## පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 01 | අධ්‍යක්‍ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | viii |
| 06 | විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxviii |
| 07 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01 |
| 08 | නිපුණතාව 1 | 02 |
| 09 | නිපුණතාව 2 | 06 |
| 10 | නිපුණතාව 3 | 11 |
| 11 | නිපුණතාව 4 | 15 |
| 12 | නිපුණතාව 5 | 19 |
| 13 | නිපුණතාව 6 | 25 |
| 14 | නිපුණතාව 7 | 42 |
| 15 | නිපුණතාව 8 | 44 |
| 15 | නිපුණතාව 9 | 47 |
| 15 | නිපුණතාව 10 | 48 |
| 16 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 49-50 |

# හින්දි

# විෂය නිර්දේශය

# 12 ශ්‍රේණිය

# විෂය හැඳින්වීම

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන අතර, උතුරු ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක වෙසෙන ඉන්දියානු ජනගහනයෙන් අඩකට ආසන්න ජනතාවගේ මාතෘ භාෂාව ද වේ. මීට අමතර ව සූරිනාම්, ෆීජී, ගයානා මොරිෂස් වැනි රටවල බහුල වශයෙන් ද, ලෝකයේ වෙනත් රටවල් රාශියක ද හින්දී භාෂාව භාවිත වෙනු දක්නට ලැබෙයි. එමෙන් ම, ලෝකයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලය රාශියක සහ වෙනත් ආයතන රාශියක ද විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව උගන්වනු ලබයි.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යික, දේශපාලනික, ආර්ථික හා සමාජීය සම්බන්ධතාත් හේතු කොට ගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයනට අතිශයින් වැදගත් වෙයි. විශේෂයෙන් ම සංගීතය, නර්තනය, චිත්‍ර ආදි පෙරදිග කලාවන් මෙන් ම ආයුර්වේදය, පුරා විද්‍යාව, ඉතිහාසය, අන්තර්ජාතික අධ්‍යයන වැනි විෂය ක්ෂේත්‍ර හැදෑරීමේ දී ද හින්දී භාෂාව අත්‍යවශ්‍ය ය.

මීට අමතර ව සංචාරක, ව්‍යාපාර, ජනමාධ්‍ය, මැද පෙරදිග සේවා, භාෂා පරිවර්තනය වැනි ක්ෂේත්‍ර හා ගනුදෙනු කිරීමේ දී හින්දී භාෂා ඥානය ප්‍රයෝජනවත් වේ.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්

- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය

හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම, හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

# විෂය අධ්‍යයනයේ අරමුණු

01. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව කථා කිරීම, ලිවීම, කියවීම හා ශ්‍රවණ හැකියාව ලබා ගැනීම හා ඒ මගින් අන්තර්ජාතික ප්‍රජාව අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගැනීම.

02. සන්නිවේදන කුසලතා සංවර්ධනය කර ගැනීම හා එමගින් විවිධ ක්ෂේත්‍රවලට අදාළ අන්තර්ජාතික සබඳතා ඇති කර ගැනීම.

03. හින්දී වාංමාලාව හා හින්දී බසෙහි ව්‍යාකරණ රටා ඉගෙනීම.

04. හින්දී භාෂාව ස්ව භාෂාවට පරිවර්තනය කිරීමෙන් සහ ස්ව භාෂාව හින්දී භාෂාවට පරිවර්තනය කිරීමෙන් පරිවර්තන හැකියාව වර්ධනය කර ගැනීම.

05. ඉන්දියානු ජන ජීවිතය සහ සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම, එමගින් සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගැනීම හා විචාරශීලී චින්තනය සංවර්ධනය කර ගැනීම.

06. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂා අධ්‍යයන ක්‍රමවේද සංවර්ධනය.

07. සාහිත්‍ය රසාස්වාදයට යොමු වීම.

## හින්දි විෂය - 12 ශ්‍රේණිය
## පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 2.1, 2.2, 2.3<br>3.1, 3.2, 3.3, 4.1, 4.2<br>5.1, 5.2<br>6.1, 6.2, 6.3, 7.1 | 100 |
| | II | 4.3, 4.4, 4.5, 5.1, 5.2, 5.3<br>5.4, 5.5, 5.6,<br>6.3, 6.4<br>7.2, 8.1 | 100 |
| | III | 4.6, 6.2, 6.5, 6.6<br>8.1, 8.2, 8.3, 8.4,<br>9.1, 9.2<br>10.1, 10.2 | 100 |
| | | එකතුව | 300 |

## හින්දී විෂය නිර්දේශය -2017

**12 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි. | 1.1 භාරතයේ ප්‍රාන්ත නම් කරයි.<br><br>1.2 හින්දී භාෂක කලාපය නම් කරයි. | • භාරතයේ ප්‍රාන්ත<br>• හින්දි භාෂක කලාපයට අයත් ප්‍රාන්ත | • භාරතයේ භූගෝලීය පිහිටීම විස්තර කරයි.<br>• භාරතයේ ප්‍රාන්ත නම් කරයි.<br>• හින්දී භාෂක කලාපය, සිතියමක නම් කරයි. | 02<br><br>03 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි. | 2.1 සම්මත වර්ණමාලාව නිවැරදි ව උච්චාරණය කරයි. | • සිංහල හා හින්දී වර්ණමාලාවෙහි ඇති උච්චාරණ වෙනස්කම් හඳුනා ගැනීම.<br>• अ, ऋ, ऐ, औ යන ස්වර උච්චාරණය.<br>• ण, ज्ञ යන ව්‍යංජන උච්චාරණය.<br>• හින්දියෙහි අනුනාසික ස්වර උච්චාරණය.<br>• ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජන උච්චාරණය.<br>• क़, ख़, ग़, ज़, फ़ යන ඝෘණීකෘත ව්‍යංජන උච්චාරණය.<br>• හින්දියෙහි මහප්‍රාණ ව්‍යංජන උච්චාරණය. | • ස්වර හා ව්‍යංජන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• अ, ऋ, ऐ, औ යන ස්වරවල විශේෂතා හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>• ण, य, व, ष, ह, ज्ञ ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>• අනුස්වාරය, අර්ධ අනුස්වාරය හා මහප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.<br>• क़, ख़, ग़, ज़, फ़ ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි. | • ह ට පෙර अ ස්වරයේ උච්චාරණය<br>• ह ට පෙර ए ස්වරයේ උච්චාරණය<br>• य ට පෙර ऐ ස්වරයේ උච්චාරණය<br>• व ට පෙර औ ස්වරයේ උච්චාරණය<br>• පදාන්ත अ ස්වරය ලොප් වීම<br>• අල්පප්‍රාණ-මහප්‍රාණ භේදය දක්වෙන වචන උච්චාරණය<br>• අනුනාසික ස්වර ඇතුළත් වචන උච්චාරණය<br>• මූර්ධන්‍ය ण දැක්වෙන වචන උච්චාරණය | • පදාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කරයි.<br>• ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කරයි.<br>• ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව 'එ' ලෙස උච්චාරණය කරයි.<br>• य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කරයි.<br>• व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කරයි. | 15 |
| | 2.3 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. | • අල්පප්‍රාණ-මහප්‍රාණ, මූර්ධන්‍ය ව්‍යංජන සහිත වචන ඇතුළත් වාක්‍ය නිවැරදි ව උච්චාරණය<br>• ආඝාත, අනුතාන සහිත ව වාක්‍ය උච්චාරණය<br>• උච්චාරණ විශේෂතා ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය උච්චාරණය | • අල්පප්‍රාණ, මහප්‍රාණ, මූර්ධන්‍ය, ඝෘෂ්ණීකෘත උත්ක්ෂිප්ත් ව්‍යංජන සහ अ, ए, ऐ ,औ අර්ධ අනුස්වාර ස්වර සහිත වචනවල විශේෂ උච්චාරණ සහිත ව වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.<br>• භාෂණයේදී අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කරයි.<br>• භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා අනුතානය සහිත ව වාක්‍ය උච්චාරණය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි. | 3.1 සම්මත වර්ණමාලාව නිවැරදි ව ලියයි. | • ස්වර, ව්‍යංජන, සංයුක්ත ව්‍යංජන. | • හින්දී වර්ණමාලාවේ ස්වර ලියා දක්වයි.<br>• හින්දී වර්ණමාලාවේ ව්‍යංජන ලියා දක්වයි.<br>• සංයුක්ත අකුරු ලියයි. | 06 |
| | 3.2 හින්දී වර්ණමාලාව භාවිත කර නිවැරදි ව වචන ලියයි. | • පිලි පිළිබඳ සම්මත භාවිතය.<br>• හල් කිරීම, අනුස්වාරය, අර්ධඅනුස්වාරය, විසර්ගය, උත්ක්ෂිප්ත ව්‍යංජන, රකාරාංශය, රේඵය ආදියෙහි සම්මත නීති භාවිත කර වචන ලිවීම. | • ස්වර පිල්ලම් භාවිත කරමින් වචන ලියයි.<br>• හල් කිරීම භාවිත කරමින් වචන ලියයි.<br>• අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.<br>• අර්ධ අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.<br>• විසර්ගය භාවිත කරමින් වචන ලියයි.<br>• රේඵය භාවිත කරමින් වචන ලියයි.<br>• උත්ක්ෂිප්ත ධ්වනි භාවිත කරමින් වචන ලියයි.<br>• රකාරාංශය භාවිත කරමින් වචන ලියයි. | 10 |
| | 3.3 හින්දියෙන් වාක්‍ය ලියයි. | • සම්මත ව්‍යාකරණ භාවිත කරමින් වාක්‍ය ලිවීම. | • නිවැරදි අක්ෂර වින්‍යාසය සැලකිල්ලට ගෙන වාක්‍ය ලියයි.<br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි.<br>• සම්මත ව්‍යාකරණ භාවිත කරමින් වාක්‍ය ලියයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | 4.1 සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි. | • හින්දී ශබ්ද උච්චාරණයට සවන් දී අකුරු හඳුනා ගැනීම.<br>• සිංහල භාෂාවේ නොමැති හින්දියට ආවේණික ශබ්ද හඳුනා ගැනීම. | • අල්පප්‍රාණ සහ මහප්‍රාණ අකුරුවල උච්චාරණයන්ට සවන් දී ඒවායෙහි වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල උච්චාරණයන්ට සවන් දී සිංහල භාෂාවෙන් වෙනස් වන අයුරු ප්‍රකාශ කරයි. | 05 |
| | 4.2 සවන් දී වචන හඳුනා ගනියි. | • ලේඛනයට වෙනස් වූ උච්චාරණ සහිත වචන.<br>• රේඵය, අනුස්වාරය, අර්ධ අනුස්වාරය, විසර්ගය, රකාරාංශය යෙදෙන වචන. | • වචනාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයී<br>• व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• අනුස්වාරය හා අර්ධානුස්වාරය අතර ඇති වෙනස උච්චාරණයට සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 වාක්‍යවලට සවන් දී අර්ථාවබෝධයෙන් ප්‍රතිචාර දක්වයි. | • උච්චාරණයට අනුව ප්‍රශ්නයක් ද, ප්‍රකාශයක් ද, විස්මය දනවන්නක් ද යන්න හඳුනා ගැනීම. | • වාක්‍යවලට සවන් දී අර්ථය ප්‍රකාශ කරයි.<br>•. වාක්‍යවලට සවන් දී විධානය වටහා ගෙන ප්‍රතිචාර දක්වයි. | 08 |
| 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි | 5.1 අවස්ථානුකූල ව ආචාර කරයි. | • විවිධ පුද්ගලයින්ට, හමුවීමකදී සහ වෙන් වීමකදී ආචාර කිරීම සඳහා භාවිත කෙරෙන යෙදුම් හඳුනා ගැනීම. | • පූජකවරයෙකුට ආචාර කරයි.<br>• .ගුරුවරයාට අචාර කරයි.<br>• වැඩිහිටියෙකුට ආචාර කරයි.<br>• තමා හා සමාන පුද්ගලයෙකුට ආචාර කරයි. | 04 |
| | 5.2 තමා සහ වෙනත් පුද්ගලයින් හඳුන්වා දෙයි. | • තමන් ව හඳුන්වා දීම<br>• වෙනත් පුද්ගලයෙක් හඳුන්වා දීම | • තමන් හඳුන්වා දෙයි.<br>• වෙනත් කෙනෙකු හඳුන්වා දෙයි. | 04 |
| | 5.3 පෞද්ගලික තොරතුරු විමසයි. | • ප්‍රශ්නවාචක පද භාවිත කරමින් නම,ගම, වයස, පවුලේ තොරතුරු, සුවදුක් යනාදිය විමසීම. | • ප්‍රශ්නවාචක පද භාවිත කරමින් භාෂණයේ යෙදෙයි.<br>• ප්‍රශ්න අසයි.<br>• පිළිතුරු දෙයි. | 05 |
| | 5.4 අවස්ථානුකූල ව සුබ පතයි. | • උපන් දිනයකදී, විවාහයේදී, ජයග්‍රහණයකදී, විවිධ උත්සව අවස්ථාවන්වලදී සුබ පැතීම. | • අවස්ථාව හඳුනා ගෙන සුබ පතයි.<br>•<br>ප්‍රතිචාර දක්වයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.5 හැඟීම් ප්‍රකාශ කරයි. | • සතුට, අසතුට, දුක, පුදුමය, එකඟතාව විරුද්ධත්වය, කැමැත්ත, අකමැත්ත, කුසගින්න, පිපාසය සහ පාරිසරික වෙනස්කම් (රස්නය, සීතල) ප්‍රකාශ කරයි. | • හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වන වාක්‍ය රටා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන භාවිත කරයි.<br>• අවස්ථානුකූල ව හැඟීම් ප්‍රකාශ කරමින් භාෂණයේ යෙදෙයි. | 06 |
| | 5.6 ආචාරශීලී ව කථා කරයි. | • ස්තුති කිරීම, සමාව ගැනීම, අවසර ගැනීම ඔව් සහ බැහැ යනුවෙන් පැවසීම. | • ස්තුති කරයි.<br>• සමාව ගනියි.<br>• අවසර ගනියි.<br>• අවස්ථානුකූල ව ඔව් සහ බැහැ යනුවෙන් ප්‍රකාශ කරයි. | 06 |
| 6.0 මූලික ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 6.1 නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍ය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | **සම්මත හින්දී ව්‍යාකරණය සහ භාෂා ප්‍රයෝග**<br>• නාමපදවල ව්‍යාකරණානුකූල භාවිතය: වචන භේදය, ලිංග භේදය<br>• සර්වනාම පදවල ව්‍යාකරණානුකූල භාවිතය: වර්තමාන සරල සහායක ක්‍රියා (සරල් වර්ත්මාන්)<br>• විශේෂණ පදවල ව්‍යාකරණානුකූල භාවිතය<br>• විභක්ති ප්‍රත්‍ය භාවිතය: නාමපද සහ විභක්ති ප්‍රත්‍ය සර්වනාම සහ විභක්ති ප්‍රත්‍ය | • නාමපද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• සර්වනාම පද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• විශේෂණ පද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• විභක්ති ප්‍රත්‍ය භාවිත කරමින් වාක්‍ය ලියයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 විධි ක්‍රියා, සහායක ක්‍රියා, ප්‍රේරණාර්ථක් ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි. | • ක්‍රියා ප්‍රභේද : විධි ක්‍රියා සහායක ක්‍රියා चाहिए, सकना, लगना, पड़ना, चुकना ප්‍රේරණාර්ථක් ක්‍රියා (ප්‍රයෝජ්‍ය ක්‍රියා) | • විධික්‍රියා රූප හඳුනා ගෙන වාක්‍යවල යොදයි.<br>• සහායක ක්‍රියා හඳුනා ගෙන භාවිත කරයි.<br>• ප්‍රේරණාර්ථක් (ප්‍රයෝජ්‍ය ක්‍රියා) හඳුනා ගෙන වාක්‍යවල යොදයි. | 15 |
| | 6.3 වර්තමාන කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • වර්තමාන කාලය -සරල වර්තමානය, සාමාන්‍ය වර්තමානය, තාත්කාලික් වර්තමානය, ආභ්‍යාසික් වර්තමානය, සංදේහාත්මක් වර්තමානය | • වර්තමාන ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන යොදයි.<br>• වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කර ගෙන භාවිත කරයි. | 15 |
| | 6.4 අනාගත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • අනාගත කාලය- සරල් භවිෂ්‍ය, සාමාන්‍ය භවිෂ්‍ය, සම්භාව්‍ය භවිෂ්‍ය | • සරල් භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• සාමාන්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• සම්භාව්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• අනාගත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කර ගෙන වාක්‍ය නිවැරදි ව ලියයි. | 07 |
| | 6.5 අතීත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • අතීත කාලය - සරල් භූත්, තාත්කාලික් භූත්, ආභ්‍යාසික් භූත්, සාමාන්‍ය භූත්, ආසන්න භූත්, පූර්ණ භූත්, සංදේහාත්මක් භූත්<br>• සමාපක් භූත් | • අතීතකාල ක්‍රියාපද නිර්මාණ කරයි.<br>• ක්‍රියාවේ අකර්මක, සකර්මක භේදය හඳුනා ගෙන යොදයි.<br>• අතීත කාල ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන භාවිත කරයි.<br>• අතීත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන අදහස් ප්‍රකාශ කරයි. | 13 |
| | 6.6 හින්දී සංඛ්‍යාංකනය පිළිබඳ අවබෝධය ලබයි. | • සංඛ්‍යාංකනය (1 සිට 100 දක්වා හින්දී සංඛ්‍යා නාම සහ අපූර්ණ සංඛ්‍යා) ගණන සංඛ්‍යා, ක්‍රමවාචී සංඛ්‍යා, ගුණවාචී සංඛ්‍යා, යෝගවාචී සංඛ්‍යා | • 1-100 දක්වා පූර්ණ සංඛ්‍යා හින්දියෙන් දක්වයි.<br>• කාල, භාග, තුන්කාල ආදි අපූර්ණ සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.<br>• ක්‍රමවාචී, ගුණවාචී, යෝගවාචී සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.<br>• මිනුම් ඒකක හින්දියෙන් දක්වයි<br>• වේලාව සහ වර්ෂ ප්‍රකාශ කරයි.<br>• දහස, ලක්ෂය, කෝටිය යන සංඛ්‍යා ප්‍රකාශ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 කියවා ප්‍රතිචාර දක්වයි | 7.1 ශබ්ද නගා කියවයි. | • සරල වාක්‍ය සරල ගද්‍ය හා පද්‍ය පාඨ යනාදිය හඬ පාලනයෙන් යුතු ව කියවීම | • වචන පැහැදිලි ව උච්චාරණය කරමින් කියවයි.<br>• අවබෝධයෙන් යුතු ව හඬ පාලනය කරමින් කියවයි. | 08 |
| | 7.2 නිශ්ශබ්ද ව කියවා අර්ථය අවබෝධ කර ගනියි. | • සරල ඡේදයක්, කථාන්තරයක්, ආරාධනා පත්‍රයක්, සුබ පැතුම්පතක්, ලිපියක්, පණිවිඩයක් යනාදිය. | • දෙන ලද පාඨය කියවා නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.<br>• දෙන ලද පාඨය නිශ්ශබ්ද ව කියවා පිළිතුරු ලකුණු කරයි.<br>• පිළිතුරු තෝරයි.<br>• හරි වැරදි ලකුණු කරයි. | 10 |
| 8.0 පරිවර්තනය කරයි. | 8.1 සරල හින්දී වාක්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කරයි. | • සරල හින්දී වාක්‍ය | • දී ඇති සරල වාක්‍ය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 08 |
| | 8.2 සරල හින්දී ගද්‍ය හා පද්‍ය පාඨ සිංහල/ දෙමළ/ ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කරයි. | • සරල හින්දී ගද්‍ය හා පද්‍ය පාඨ | • සරල ගද්‍ය සහ පද්‍ය පාඨවල අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 08 |
| | 8.3 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි සරල වාක්‍ය හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය සහ සරල ගද්‍ය පාඨ | • දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 08 |
| | 8.4 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | | • සරල ගද්‍ය පාඨ අවබෝධ කර ගෙන හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 9.1 ගද්‍ය කියවා රස විඳියි. චරිතායනය කරයි. | • ගද්‍ය පාඨ කියවා රසවිඳීම.<br>• අවස්ථා සම්බන්ධය දැක්වීම. | • ගද්‍යාංගය නිවැරදි ව කියවයි.<br>• දුරවබෝධ පදවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් අවස්ථා සම්බන්ධය දක්වයි.<br>• ගද්‍යාංගයට අදාළ පණිවිඩය ප්‍රකාශ කරයි. | 20 |
| | 9.2 පද්‍ය කියවා රසවිඳියි. චරිතායනය කරයි. | • පද්‍ය පාඨ කියවා රසවිඳීම සහ අර්ථය සරල හින්දී බසින් ලිවීම. | • හැඟීම් දනවන පරිදි රිද්මයකට අනුව පද්‍ය ගායනා කරයි.<br>• දුරවබෝධ පදවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• සම්මත වාක්‍ය රටාවෙන් බැහැර ව පද්‍යයේ දී පද ගැළපෙන බව කියයි.<br>• රසවින්දනය සඳහා අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• පද්‍යයේ අර්ථය සරල හින්දියෙන් ප්‍රකාශ කරයි. | 20 |
| 10.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. | 10.1 නූතන හින්දී සාහිත්‍යයේ යුග නම් කරයි. | • නූතන යුගය : භාරතේන්දු යුගය, ද්විවේදී යුගය, ඡායාවාදී යුගය, ඡායාවාදෝත්තර යුගය. | • කාලවකවානුව සහිත ව සාහිත්‍යයික යුග නම් කරයි. | 10 |
| | 10.2 නූතන හින්දී සාහිත්‍යයේ යුග පසුබිම විස්තර කරයි. | | • යුග පසුබිම විස්තර කරයි.<br>• යුගයේ සාහිත්‍යයික විශේෂතා නම් කරයි. | 12 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ** :

01. **මන්ථන් හින්දී පාඨාවලී** (2010) සරස්වතී හවුස් ප්‍රයිවෙට් ලිමිටඩ්, නවදිල්ලී.

02. **භාෂා භාරතී භාග්** 1 (2007) හාර් කී ජීත් - සුදර්ශන් සහ දුඛ් කා අධිකාර්- යශ්පාල්, යුනයිටඩ් පබ්ලිෂින්ග් හවුස්, නවදිල්ලී.

03. **නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය** (2009) (සංශෝධිත සංස්කරණය), උපුල් රංජිත් හේවාවිතානගමගේ.

**පරිශීලන ග්‍රන්ථ** :

01. **බාල් හින්දී ව්‍යාකරණ් තථා රචනා**', ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

02. '**කථා සරිතා**' (භාග් 3, 4), දිවාකර් පාණ්ඩේය, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

03. '**හින්දී වියරණ හුරුව**' (2005, 2008 පළමු සංස්කරණය) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

04. '**හින්දී ලේඛන හුරුව**' (2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.

05. '**හින්දී කථන හුරුව**' (2010) ඉන්ද්‍රා දසනායක, ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

5.1 **'විශ්ව හින්දී දිනය/හින්දී භාෂා දිනය'** සැමරීම.

5.2 ස්ව නිර්මාණ ද ඇතුළත් **'හින්දී සඟරාවක්'** නිර්මාණය කිරීම.

5.3 පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

5.4 උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5.5 පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කථික, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

5.6 හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තද්විෂය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

# තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතයි.

- 13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා  මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

- මෙම විෂය නිර්දේශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.

- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.

# ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදය

4.1 ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

4.1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට උච්චාරණයට අදාළ ශබ්ද හඳුනා ගැනීමට සැලැස්වීම.

4.1.2 කියවන විට ලිවීම

4.1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

4.1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනා ගැනීමට සැලැස්වීම.

4.2 ව්‍යාකරණය

4.2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

4.2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

4.3 සංවාද පුහුණුව

4.3.1 සිසුන්ගෙන් උත්තර බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

4.3.2 උත්තරයට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

4.3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

4.3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

4.3.5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් සංවාද පුහුණු කිරීම.

4.4 පන්තිය තුළ ම හින්දී පොතපත කියවීම පුහුණු කිරීම සඳහා පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

4.5 අන්තර්ජාලය පරිහරණයෙන් හින්දී භාෂා ඥානය වර්ධනය කර ගැනීම.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 12 ශ්‍රේණිය - හින්දී

**නිපුණතාව** 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** 1.1 භාරතයේ ප්‍රාන්ත නම් කරයි.

**කාලච්ඡේද** 02

**ඉගෙනුම් පල**

- භාරතයේ භූගෝලීය පිහිටීම විස්තර කරයි.
- භාරතයේ ප්‍රාන්ත සංඛ්‍යාව ප්‍රකාශ කරයි.
- උත්තර භාරතයේ ප්‍රාන්ත නම් කරයි.
- දක්ෂිණ භාරතයේ ප්‍රාන්ත නම් කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- භාරතය උතුරින් හිමාලය කඳු වැටියෙන් ද, දකුණින් ඉන්දියන් සාගරයෙන් ද, නැගෙනහිරින් බෙංගාල බොක්කෙන් හා බටහිරින් අරාබි මුහුදින් වට වී ඇති බව.
- භාරතයේ ප්‍රාන්ත සංඛ්‍යාව 29ක් බව.
- ජම්මු කශ්මීර්, හිමාචල් ප්‍රදේශ්, පංජාබ්, හර්යානා, උත්තරාඛණ්ඩ්, උත්තර් ප්‍රදේශ්, බිහාර්, ඣාර්ඛණ්ඩ්, මධ්‍ය ප්‍රදේශ්, රාජස්ථාන්, ගුජ්රාත්, ඡත්තීස්ගඪ්, උඩිසා, බටහිර බෙංගාලය, අසැම්, අරුණාචල් ප්‍රදේශ්, නාගාලන්ඩ්, මණිපූර්, ත්‍රිපුරා, මහාරාෂ්ට්‍ර සහ ගෝව උත්තර භාරතයේ ප්‍රාන්ත බව.
- කර්ණාටක්, ආන්ද්‍රා ප්‍රදේශ්, තමිල්නාඩු සහ කේරල් දක්ෂිණ භාරතයේ ප්‍රාන්ත බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ප්‍රාන්ත නම් කරන ලද භාරතයේ බිත්ති සිතියමක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ප්‍රාන්ත අංකනය කරන ලද භාරතයේ සිතියමක් සිසුන්ට ලබා දෙන්න.
- භාරතයේ භූගෝලීය සීමා පැහැදිලි කර දෙන්න.
- භාරතයේ ප්‍රාන්ත නම් කරමින් ප්‍රාන්ත සංඛ්‍යාව අවබෝධ කර දෙන්න.
- එම ප්‍රාන්ත උතුරු හා දකුණු වශයෙන් බෙදෙන ආකාරය වටහා දෙන්න.
- අංකනය කරන ලද සිතියමේ ප්‍රාන්ත නම් කර කේවල වශයෙන් ප්‍රදර්ශනය කරමින් වාචික ව ඉදිරිපත් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- භාරතයේ ප්‍රාන්ත ලකුණු කරන ලද බිත්ති සිතියම.
- අංකනය කරන ලද සිතියම්, පාට පැන්සල්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- භාරතයේ භූගෝලීය සීමා නිවැරදි ව ප්‍රකාශ කරයි.
- උත්තර භාරතයේ ප්‍රාන්ත සංඛ්‍යාව ප්‍රකාශ කරයි.
- දක්ෂිණ භාරතයේ ප්‍රාන්ත සංඛ්‍යාව ප්‍රකාශ කරයි.
- උත්තර භාරතයේ ප්‍රාන්ත නම් කරයි.
- දක්ෂිණ භාරතයේ ප්‍රාන්ත නම් කරයි.

**නිපුණතාව** 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** 1.2 හින්දී භාෂක කලාපය නම් කරයි.

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර වන ප්‍රධාන භාෂාව නම් කරයි.
- හින්දී භාෂක කලාපය හඳුනා ගෙන සිතියමක ලකුණු කරයි.
- හින්දී භාෂාව සංස්කෘත භාෂාවෙන් විකසනය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව ප්‍රකාශ කරයි.
- හින්දී භාෂාවේ උපභාෂා නම් කරයි.
- හින්දී භාෂාවේ ප්‍රදේශීය ව්‍යවහාර සංඛ්‍යාත්මක ව ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- භාරතයේ එක් එක් ප්‍රාන්තවල විවිධ භාෂා ව්‍යවහාර වන බව.
- එක් එක් ප්‍රාන්තයට ප්‍රධාන වූ භාෂාවක් ඇති බව.
- හින්දී භාෂාව ප්‍රාන්ත කිහිපයක ම ජනතාවගේ මාතෘ භාෂාව වන බව.
- හින්දී භාෂාව සංස්කෘත භාෂාවෙන් විකසනය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව.
- හින්දී භාෂාව භාරතයේ රාජ්‍ය භාෂාව වන බව.
- පශ්චිමී හින්දී, පූර්වී හින්දී, පහාඩී හින්දී, බිහාරී සහ රාජස්ථානී හින්දී භාෂාවේ උපභාෂා වන බව.
- එම උපභාෂාවල ප්‍රදේශීය ව්‍යවහාර 18ක් ඇති බව.
- භාරතයේ ජාතික භාෂාව හින්දී වන බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- භාරතයේ ප්‍රාන්ත අංකනය හා නම් කරන ලද සිතියම සිසුන්ට ලබා දෙන්න.
- එක් එක් ප්‍රාන්තවල ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව දක්වෙන වගුවක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- වගුව ඇසුරෙන් එක් එක් ප්‍රාන්තවල ව්‍යවහාර කෙරෙන භාෂාව පිළිබඳ ව සිසුනට අවබෝධයක් ලබා දෙන්න.
- හින්දී භාෂාව ව්‍යවහාර වන ප්‍රාන්ත එක් වර්ණයකින් සිතියමේ සේයා කිරීමට උපදෙස් දෙන්න.
- හින්දී භාෂාවේ විකාශනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- හින්දී භාෂාවේ උපභාෂා 5ක් සහ ප්‍රදේශීය ව්‍යවහාර 18ක් ඇති බව පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- භාරතයේ ප්‍රාන්ත අංකනය කරන ලද සිතියම.
- භාරතීය ප්‍රාන්ත භාෂා දැක්වෙන වගුවක්
- පාට පැන්සල්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- හින්දී භාෂක කලාපය තෝරයි.
- හින්දී භාෂක කලාපය නම් කරයි.
- හින්දී භාෂක කලාපය සිතියමක සේයා කර දක්වයි.
- දෙන ලද ප්‍රාන්තවල ප්‍රධාන භාෂාව නම් කරයි.
- දෙන ලද භාෂා ව්‍යවහාර වන ප්‍රාන්ත ලකුණු කරයි.
- හින්දී භාෂාවේ උපභාෂා නම් කරයි.
- හින්දී භාෂාවේ ප්‍රදේශීය ව්‍යවහාර ප්‍රකාශ කරයි.

**නිපුණතාව** 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතා මට්ටම** 2.1 සම්මත වර්ණමාලාව නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- ස්වර හා ව්‍යංජන නිවැරදි ව උච්චාරණය කරයි.
- अ, ऋ, ऐ, औ යන ස්වරවල විශේෂතා හඳුනාගෙන උච්චාරණය කරයි.
- ण, य, व, ष, ह, ज्ञ ව්‍යංජනවල විශේෂතා හඳුනාගෙන උච්චාරණය කරයි.
- අනුස්වාරය, අර්ධ අනුස්වාරය හා මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.
- क़, ख़, ग़, ज़, फ़ ව්‍යංජනවල විශේෂතා හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.
- ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජනවල විශේෂතා හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සිංහල හා හින්දී වර්ණමාලාවෙහි උච්චාරණ වෙනස්කම් ඇති බව.
- अ, ऋ, ऐ, औ යන ස්වර උච්චාරණය සිංහල උච්චාරණයට වඩා වෙනස් වන බව.
- ण, ज्ञ යන ව්‍යංජනවල උච්චාරණය සිංහල උච්චාරණයට වඩා වෙනස් වන බව.
- හින්දී භාෂවෙහි තුළ අනුනාසික ස්වර උච්චාරණය වන බව.
- ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජනවල උච්චාරණය ड, ढ ව්‍යංජනවල උච්චාරණයට වඩා වෙනස් වන බව.
- क़, ख़, ग़, ज़, फ़ යන ව්‍යංජන क, ख, ग, ज, फ යන ව්‍යංජන උච්චාරණයට වඩා වෙනස් වන බව.
- හින්දියෙහි අල්පප්‍රාණ සහ මහාප්‍රාණ ව්‍යංජන වෙනස ශබ්දෝච්චාරණයේ දී අනිවාර්ය බව.
- श හා ष ව්‍යංජනවල උච්චාරණ විශේෂතා ඇති බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- හින්දී වර්ණමාලාවේ ඡායා පිටපතක් සිසුන්ට ලබා දෙන්න.
- විශාලනය කරන ලද වර්ණ මාලාවක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- හඬ පටයක් මඟින් හෝ ගුරුවරයා මඟින් හෝ නිවැරදි උච්චාරණය හඳුන්වා දෙන්න.
- ගුරුවරයා අනුගමනය කරමින් නිවැරදි උච්චාරණය හුරු කරවන්න.
- විශේෂ උච්චාරණ ඇති ස්වරවල හා ව්‍යංජනවල නිවැරදි උච්චාරණය හුරු කරවන්න.
  (अ, ऋ, ऐ, औ, ण, ज्ञ, ड़, ढ़, क़, ख़, ग़, ज़, फ़, श, ष)
- අල්පප්‍රාණ හා මහාප්‍රාණ නිවැරදි ව උච්චාරණය කිරීම සඳහා යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සම්මත හින්දී වර්ණමාලාවේ ඡායා පිටපත්
- සම්මත හින්දී වර්ණමාලාවේ උච්චාරණ ඇතුළත් හඬ පට
- සම්මත හින්දී වර්ණමාලාව දැක්වෙන පුවරුව
- හින්දී වර්ණමාලාව ඇතුළත් කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සම්මත හින්දී ස්වර උච්චාරණය කරයි.
- සම්මත හින්දී ව්‍යංජන උච්චාරණය කරයි.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ නිවැරදි ව උච්චාරණය කරයි.
- උත්ක්ෂිප්ත් ව්‍යංජන නිවැරදි ව උච්චාරණය කරයි.
- උච්චාරණ විශේෂතා ඇති अ, ऋ, ऐ, औ, ण, ज्ञ, ड़, ढ़, क़, ख़, ग़, ज़, फ़, श, ष ස්වර හා ව්‍යංජන නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතාව** 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතා මට්ටම** 2.2 හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- පදාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කරයි.
- **ह**ට පෙර ඇති **अ** ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කරයි.
- **ह**ට පෙර ඇති **ए** ස්වරය හ්‍රස්ව 'එ' ලෙස උච්චාරණය කරයි.
- **य**ට පෙර ඇති **ऐ** ස්වරය 'අයි' ලෙස උච්චාරණය කරයි.
- **व**ට පෙර ඇති **औ** ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පදාන්ත अ ස්වරය ලොප් වන බව.
- हට පෙර अ ස්වරය හුස්ව 'ඇ' ලෙස උච්චාරණය වන බව.
- हට පෙර ए ස්වරය 'එ' ස්වරය ලෙස උච්චාරණය වන බව.
- यට පෙර ऐ ස්වරය 'ඓ' ලෙස උච්චාරණය වන බව.
- वට පෙර औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය වන බව.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ උච්චාරණය භේදය අනුව අර්ථය වෙනස් වන බව.
- නාසික්‍ය හා අනුනාසික්‍ය උච්චාරණ භේද අනුව අර්ථය වෙනස් වන බව. (हंस– हँस)

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉහත උච්චාරණ නියමවලට අදාළ ව ශබ්දාවලි කිහිපයක් සකස් කරන්න.
- එම ශබ්දාවලී පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම ශබ්දාවලී උච්චාරණය කර පෙන්වන්න.
- එම ශබ්දාවලී සිසුන් ලවා උච්චාරණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශබ්දාවලී
- සම්මත හින්දී වචන උච්චාරණ ඇතුළත් හඬ පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- පදාන්ත अ ලොප් වන වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- ह ට පෙර अ ස්වරය ඇති වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- ह ට පෙර ए ස්වරය ඇති වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- य ට පෙර ऐ ස්වරය ඇති වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- व ට පෙර औ ස්වරය ඇති වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය දැක්වෙන වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- නාසික්‍ය හා අනුනාසික්‍ය සහිත වචන නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතාව** 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතා මට්ටම** 2.3 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- අල්පප්‍රාණ, මහාප්‍රාණ, නාසික්‍ය, ඝෘෂ්ණීකෘත උත්ක්ෂිප්ත් ව්‍යංජන සහ **अ, ए, ऐ ,औ** යන ස්වරවල විශේෂ උච්චාරණ සහිත වචන ඇතුළත් වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.
- භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කරයි.
- භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා අනුතානය සහිත ව වාක්‍ය උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වාක්‍යවල යෙදෙන අල්පප්‍රාණ, මහාප්‍රාණ, ඝෘෂ්ණීකෘත, නාසික්‍ය, උත්ක්ෂිප්ත් ව්‍යංජන සහ अ, ए, ऐ, औ ස්වර සහිත වචන ඇතුළත් වාක්‍ය සම්මත රීතී අනුව උච්චාරණය කළ යුතු බව.
- භාෂණයේ දී අර්ථ සන්නවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කළ යුතු බව.
- භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා අනුතානයට අනුව උච්චාරණය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අනුතානය හා ආඝාතය සහිත වාක්‍ය පන්තියෙහි ප්‍රදර්ශනය කරන්න.
- එම වාක්‍ය උච්චාරණය කර පෙන්වන්න.
- සිසුන් සමඟ එක් ව උච්චාරණය කරන්න.
- කේවල වශයෙන් එක් ව උච්චාරණය කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය හඬ පට
- වාක්‍ය ඇතුළත් ඡායා පිටපත්
- මාකර් පෑන්, සුදු කඩදාසි, වයිට් බෝඩ්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ආඝාතය හා අනුතානය සහිත වාක්‍ය උච්චාරණය කර ගම්‍ය වන අර්ථය විමසයි.
- වාක්‍ය සපයා ආඝාතය හා අනුතානය අනුව උච්චාරණය කරයි.
- අදාළ ආඝාතය හා අනුතානයට අනුව සුදුසු සංකේත යොදයි.

**නිපුණතාව** 3.0 හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**නිපුණතා මට්ටම** 3.1 සම්මත හින්දී වර්ණමාලාව නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- සම්මත හින්දී වර්ණමාලාවේ ස්වර ලියා දක්වයි.
- හින්දී වර්ණමාලාවේ ව්‍යංජන ලියා දක්වයි.
- සංයුක්ත අක්ෂර ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ස්වර හා ව්‍යංජන ලෙස සම්මත හින්දී වර්ණමාලාව බෙදෙන බව.
- සම්මත හින්දී වර්ණමාලාවේ අක්ෂර ලිවීමේ දී ශීරෝ රේඛාවක් යෙදිය යුතු බව.
- සම්මත හින්දී අක්ෂර अंत खड़ीपाई, मध्य खड़ीपाई සහ बिना खड़ीपाई වශයෙන් බෙදෙන බව.
- क्ष, त्र, ज्ञ, श्र වශයෙන් සම්මත හින්දී සංයුක්තාක්ෂර කිහිපයක් වන බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සම්මත හින්දී වර්ණමාලාව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සම්මත හින්දී වර්ණමාලාව ඡායා පිටපත් සිසුන්ට ලබා දෙන්න.
- පියවරෙන් පියවර අක්ෂර ලේඛන රටාව හුරු කරවන්න.
- अंत खड़ीपाई, मध्य खड़ीपाई හා बिना खड़ीपाई ලේඛනයේ දී හඳුන්වා දී ලිවීම හුරු කරවන්න.
- क्ष, त्र, ज्ञ, श्र සංයුක්තාක්ෂර හඳුන්වා දී ලිවීමට හුරු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සම්මත හින්දී වර්ණමාලාව
- අක්ෂර පියවරෙන් පියවර ලිවීම දැක්වෙන පුවරු සහ ඡායා පිටපත්
- සම්මත හා පැරණි අකුරු දැක්වෙන පුවරු

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සම්මත හින්දී ස්වර ලියා දක්වයි.
- සම්මත හින්දී ව්‍යංජන ලියා දක්වයි.
- සම්මත හින්දී සංයුක්ත ව්‍යංජන ලියා දක්වයි.
- अंत खड़ीपाई, मध्य खड़ीपाई, बिना खड़ीपाई අක්ෂර වශයෙන් අකුරු වර්ගීකරණය කරයි.

**නිපුණතාව** 3.0 හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**නිපුණතා මට්ටම** 3.2 හින්දී වර්ණමාලාව භාවිත කර නිවැරදි ව වචන ලියයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- ස්වර පිල්ලම් භාවිත කරමින් වචන ලියයි.
- හල් කිරීම භාවිත කරමින් වචන ලියයි.
- අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.
- අර්ධ අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.
- විසර්ගය භාවිත කරමින් වචන ලියයි.
- රේඵය භාවිත කරමින් වචන ලියයි.
- උත්ක්ෂිප්ත් ධ්වනි භාවිත කරමින් වචන ලියයි.
- රකාරාංශය භාවිත කරමින් වචන ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වචන ලිවීමේ දී නිවැරදි ස්වර පිල්ලම් හඳුනාගෙන භාවිත කළ යුතු ය.
- अंत खड़ीपाई හා मध्य खड़ीपाई අකුරක් හල් වන්නේ නම් එයට පසු ව යෙදෙන අකුර හා බැඳ ලිවිය යුතු බව.
- හල් වන්නේ बिना खड़ीपाई අකුරක් නම් හල් සංකේතය ( ् ) අකුර යටින් දැක්විය යුතු බව.
- අනුස්වාරය හා අර්ධ අනුස්වාරය නිරූපණය සඳහා ं සහ ँ යෙදෙන බව.
- විසර්ගය අක්ෂරාන්තයේ යෙදිය යුතු බව.
- වචනයක මැද र හල් ව යෙදේ නම් ඒ වෙනුවට ඊට පසු ව යෙදෙන අකුරට ඉහළින් ශිරෝ රේඛාව මත රේඵය ( र्‍ ) යෙදිය යුතු බව හා එම අකුරට මාත්‍රාවක් යෙදී ඇති විට එම මාත්‍රාවට පසු ව රේඵය යෙදිය යුතු බව. (दर्जी, गर्मी, सर्दी)
- උත්ක්ෂිප්ත් ධ්වනි ස්වර දෙකක් අතර, වචනාන්තය සහ අනුනාසිකායට පසු ව යෙදෙන බව. (උදා : लड़का, पेड़, ढूँढ़ना)
- රකාරාංශය සඳහා මධ්‍ය සහ අන්ත් ඛඩීපාඊ අකුරුවලට ඛඩීපාඊ රේඛාවට මෙම ( ्र ) සංකේතය යෙදෙන බව උදා : क्रम, नम्र
- ගෝලාක්ෂරවලට රකාරාංශය යෙදෙන විට ( ‸ ) සංකේතය යෙදිය යුතු බව. (උදා : ट्रक , ड्रामा, राष्ट्र)

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- යෝග්‍ය ඉගෙනුම් ආධාරක භාවිත කරමින් පිල්ලම් යෙදීම, හල් කිරීම, අනුස්වාරය හා අර්ධ අනුස්වාරය හා විසර්ගය භාවිතය, රේඵය හා රකාරාංශය භාවිතය සහ උත්ක්ෂිප්ත් ධ්වනි යෙදීම පැහැදිලි කර දෙන්න.
- ඉහත එක් එක් ලේඛන රීතියට අදාළ ව වචනාවලී සකස් කිරීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ස්වර පිල්ලම් පුවරු, වචනාවලී, ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි ව පිල්ලම් තෝරා වචන ලියයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති වචනය තෝරයි.
- රේඵය යොදා නිවැරදි වචනය ලියයි.
- රකාරංශය සුදුසු ස්ථානවල භාවිත කරයි.
- සුදුසු ස්ථානවල උත්ක්ෂිප්ත් ධ්වනි යොදයි.

**නිපුණතාව** 3.0 හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**නිපුණතා මට්ටම** 3.3 හින්දියෙන් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- නිවැරදි අක්ෂර වින්‍යාසය සැලකිල්ලට ගෙන වාක්‍ය ලියයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි.
- සම්මත වියරණ රීති භාවිත කරමින් වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය යොදා ගත යුතු බව.
- විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කළ යුතු බව.
- ලේඛනයේ දී සම්මත වියරණ රීති භාවිත කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආදර්ශනයක් ඇසුරින් සරල වාක්‍ය ගොඩනඟන ආකාරය පැහැදිලි කර දෙන්න.
- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය විරාම ලකුණු වියරණ රීති පිළිබඳ සැලකිලිමත් විය යුතු බව පැහැදිලි කර දෙන්න.
- වාක්‍ය නිර්මාණය සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම් පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල වාක්‍ය ඇතුළත් ඡායා පිටපත්.

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති පද නිවැරදි අනුපිළිවෙලින් ගළපා වාක්‍ය නිර්මාණය කරයි.
- දී ඇති වාක්‍යවලට නිවැරදි විරාම ලකුණු යොදයි.
- ගුරුවරයා ආඝාතය හා අනුතානය සහිත ව වාක්‍ය උච්චාරණය කරන විට අසා ලියයි.

**නිපුණතාව** 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 4.1 සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- අල්පප්‍රාණ හා මහාප්‍රාණ අකුරුවල උච්චාරණයන්ට සවන් දී ඒවායෙහි වෙනස හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- अ, ऐ, औ, ऋ ස්වරවල උච්චාරණවලට සවන් දී හින්දී උච්චාරණ විශේෂතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ड, ढ සහ ड़, ढ़ ව්‍යංජන උච්චාරණවලට සවන් දී වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ज़, फ़ සෘණීකෘත ව්‍යංජන හා ज, फ ව්‍යංජන උච්චාරණවලට සවන් දී වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අවධානයෙන් සවන් දී අල්ප්‍රාණ හා මහාප්‍රාණ අකුරුවල උච්චාරණ වෙනස අවබෝධ කර ගත යුතු බව.
- अ, ऐ, औ, ऋ ස්වර උච්චාරණයට සවන් දී එහි විශේෂතා හඳුනාගත යුතු බව.
- අවධානයෙන් සවන් දී ड, ढ සහ ड़, ढ़ සෘණීකෘත ව්‍යංජන උච්චාරණ අතර වෙනස හඳුනාගත යුතු බව.
- අවධානයෙන් සවන් දී ज़, फ़ සහ ज, फ ව්‍යංජන උච්චාරණ අතර වෙනස හඳුනාගත යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අල්පප්‍රාණ සහ මහාප්‍රාණ अ, ऐ, औ, ऋ , ड, ढ , ड़, ढ़ සහ ज़, फ़ ज , फ අක්ෂර දැක්වෙන වගු එකින් එක පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ගුරුවරයා එම අක්ෂර ප්‍රදර්ශනය කරන අතර සිසුන් අවධානයෙන් ඊට සවන් දීමට උපදෙස් දෙන්න.
- ඒවායේ උච්චාරණ විශේෂතා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අක්ෂර උච්චාරණයේ විශේෂතා හඳුන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය භාණ්ඩ පට
- වයිට් බෝඩ්, මාකර් පෑන්
- අක්ෂර දැක්වෙන වගු, කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සවන් දී නිවැරදි ව ශබ්දයට අදාළ අකුර තෝරයි.
- සවන් දී නිවැරදි ව ශබ්දයට අදාළ අකුර ප්‍රදර්ශනය කරයි.
- සවන් දී නිවැරදි ව ශබ්දයට අදාළ අකුර ලියයි.

**නිපුණතාව** 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 4.2 සවන් දී වචන හඳුනා ගනියි.

**කාලච්ඡේද** 07

**ඉගෙනුම් පල**

- වචනාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- **ह** ට පෙර ඇති **अ** ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- **ह** ට පෙර ඇති **ए** ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- **य** ට පෙර ඇති **ऐ** ස්වරය 'අයි' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- **व** ට පෙර ඇති **औ** ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- අනුස්වාරය හා අර්ධානුස්වාරය අතර ඇති වෙනස උච්චාරණයට සවන් දීමෙන් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වචනාන්ත ව්‍යංජනය පිල්ලමක් රහිත අවස්ථාවල දී හල් බව සවන් දී අවබෝධ කර ගත යුතු බව.
- ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස සවන් දී අවබෝධ කර ගත යුතු බව.
- ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය වන බව සවන් දී අවබෝධ කර ගත යුතු බව.
- य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දී අවබෝධ කර ගත යුතු බව.
- व ට පෙර ඇති औ ස්වරය 'අඋ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දී අවබෝධ කර ගත යුතු බව.
- අනුස්වාරය හා අර්ධානුස්වාරය අතර වෙනස සවන් දී අවබෝධ කර ගත යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉහත රීතීවල අදාළ ව එදිනෙදා ව්‍යවහාරයේ යෙදෙන වචන ඇතුළත් වචනමාලා කිහිපයක් සකස් කරන්න.
- එම වචනමාලා එකින් එක පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

- ගුරුවරයා උච්චාරණය කරන අතර සිසුන්ට අවධානයෙන් සවන් දීමට උපදෙස් දෙන්න.
- උච්චාරණය කරන අතරතුර සිසුන්ට වචනවල අර්ථාවබෝධය ලබා දීමට යෝග්‍ය ක්‍රියාකාරකම් සකස් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- චිත්‍ර ඇතුළත් කාඩ් පත්
- හඬ පට
- බ්‍රිස්ටල් බෝඩ්, ප්ලැටිග්නම්
- වීඩියෝ පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සවන් දී නිවැරදි ව පින්තූරය තෝරයි.
- සවන් දී නිවැරදි ව පිළිතුර තෝරයි.
- සවන් දී නිවැරදි ව වචනය ලියයි.
- විධානවලට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතාව** 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 4.3 වාක්‍යවලට සවන් දී අර්ථාවබෝධයෙන් ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- වාක්‍යයට සවන් දී ආඝාතයට අනුව අර්ථය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
- වාක්‍යයට සවන් දී අනුතානයට අනුව අර්ථය අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
- විධානාර්ථ වාක්‍යවලට සවන් දී උචිත ප්‍රතිචාර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආඝාතයට අනුව වාක්‍යයේ අර්ථය අවබෝධ කරගත යුතු බව.
- අනුතානයට අනුව ප්‍රශ්නයක් ද, ප්‍රකාශයක් ද, විස්මය දනවන්නක් ද යන්න හඳුනා ගත යුතු බව.
- විධානයට අනුව යෝග්‍ය ප්‍රතිචාර දැක්විය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආඝාතය සහිත සරල වාක්‍ය කිහිපයක් සකස් කර ගන්න.
- ඒවා ආඝාතය අනුව ප්‍රකාශ කරන අතර සිසුන්ට එයට සවන් දීමට යොමු කරන්න.
- ආඝාතයට අනුව අර්ථය විමසන්න.
- අනුතානයට අනුව වාක්‍ය ප්‍රකාශ කර යෝග්‍ය අර්ථය විමසන්න.
- සරල විධානාර්ථ වාක්‍ය ප්‍රකාශ කර ඊට සුදුසු ප්‍රතිචාර දැක්වීමට සිසුන් යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- වීඩියෝ දසුන්
- වයිට් බෝඩ්, මාකර් පෑන්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ආඝාතයට අනුව අර්ථය අවබෝධ කර ගෙන පිළිතුර තෝරයි / ලකුණු කරයි.
- අනුතානයට අනුව අදාළ විරාම ලකුණු භාවිත කරයි.
- අභිනය ආධාර කර ගෙන විධානවලට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.1 අවස්ථානුකූල ව ආචාර කරයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- පූජකවරයකුට ආචාර කරයි.
- ගුරුවරයාට අචාර කරයි.
- වැඩිහිටියෙකුට ආචාර කරයි.
- තමා හා සමාන පුද්ගලයෙකුට ආචාර කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පුද්ගලයන්ගේ තනතුරු, වයස, තත්ත්වය සැලකිල්ලට ගෙන යෝග්‍ය ආචාර විධි භාවිත කළ යුතු බව.
- ආචාර කිරීමට යෝග්‍ය යෙදුම් අවබෝධ කර ගත යුතු බව.
- සමුගැනීමක දී භාවිත කළ යුතු යෙදුම් අවබෝධ කර ගත යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආචාර කිරීමේ දී භාවිත කරන යෙදුම් පැහැදිලි කර දෙන්න.
- පුද්ගල ස්වභාවය අනුව යෙදුම් තෝරා ගැනීම පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- नमस्ते, नमस्कार වැනි පද පොදුවේ භාවිත කළ හැකි බවත් प्रणाम යන පදය ගරු කටයුතු අයට පමණක් භාවිත කළ යුතු බවත් පැහැදිලි කර දෙන්න.
- වෙන් වීමක දී භාවිත කළ යුතු යෙදුම් පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- වීඩියෝ පට
- චිත්‍රපට සංවාද

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- මිතුරන්ට ආචාර කරයි.
- වැඩිහිටියන්ට ආචාර කරයි.
- වෙන් වීමක දී අවස්ථානුකූල ව සුදුසු යෙදුම් භාවිත කරයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.2 තමා සහ වෙනත් පුද්ගලයන් හඳුන්වා දෙයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- තමන්ගේ නම, ගම, වයස ඇතුළු පෞද්ගලික තොරතුරු ප්‍රකාශ කරයි.
- තම පවුලේ සාමාජිකයන් පිළිබඳ හඳුන්වා දෙයි.
- තම මිතුරාගේ නම, ගම, වයස ප්‍රකාශ කරයි.
- සබකෝලයෙන් තොර ව නිරවුල් ව අදහස් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තමන්ගේ පෞද්ගලික තොරතුරු ප්‍රකාශ කිරීමට හින්දී වාක් කෝෂීය ඥානය ලබා ගත යුතු බව.
- පවුලේ සාමාජිකයන් හඳුන්වා දීමේ දී ඥාතිත්වය ප්‍රකාශ වන හින්දී වාක් කෝෂය හඳුනා ගත යුතු බව.
- වෘත්ති හඟවන හින්දී වාක් කෝෂය හඳුනා ගත යුතු බව.
- පන්තියේ හදාරන විෂය ධාරාවට අදාළ හින්දී වාක් කෝෂය හඳුනාගත යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- වෘත්තීන්, ඥාති සබඳතා, විෂයයන් අදාළ වාක් කෝෂීය ඥානය ලබා දෙන්න.
- අදහස් ප්‍රකාශ කිරීම සඳහා සුදුසු වාක්‍ය රීති හඳුන්වා දෙන්න.
- සුදුසු ආදර්ශ ලබා දෙන්න.
- භාෂණයෙහි යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- ඡායා පිටපත්
- වීඩියෝ දර්ශන

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නියමනලට අනුව නිවැරදි ව වාක්‍ය ගළපයි.
- වෘත්ති, නෑ සබඳතා, විෂයයන්ට අදාළ හින්දී නාමපද වාක්‍යවල නිවැරදි ව භාවිත කරයි.
- පැහැදිලි ව හා නිවැරදි ව වචන උච්චාරණය කරයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.3 පෞද්ගලික තොරතුරු විමසයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- ප්‍රශ්න වාචක පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රශ්න වාචක පද භාවිත කරමින් ප්‍රශ්න අසයි.
- අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තොරතුරු විමසීම සඳහා අදාළ ප්‍රශ්නවාචක පද හඳුනාගත යුතු බව.
- අවස්ථානුකූල ව ප්‍රශ්නවාචක පද භාවිත කළ යුතු බව.
- ආචාරශිලී ව පිළිතුරු දීමට අදාළ යෙදුම් භාවිත කළ යුතු බව.
- සංවාදයේ දී හඬ පාලනයට අවධානය දිය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ප්‍රශ්න වාචක පද හා එහි භාවිතය හඳුන්වා දෙන්න.
- ප්‍රශ්න වාචක පද ඇතුළත් ආදර්ශ සිසුන්ට ලබා දෙන්න.
- සිසුන් සංවාදයේ යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට
- සංවාද ඇතුළත් පත්‍රිකා
- වීඩියෝ දර්ශන

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ප්‍රශ්න වාචක පද නිවැරදි ව යොදයි.
- ප්‍රශ්නවලට නිවැරදි ව පැහැදිලි ව පිළිතුරු දෙයි.
- හඬ පාලනය කරමින් ආචාරශීලී ව භාෂණයේ යෙදෙයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.4 අවස්ථානුකූල ව සුබ පතයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- සුබ පැතීමේ දී භාවිත වන යෙදුම් හඳුනා ගෙන කියයි.
- අවස්ථානුකූල ව සුබ පතයි.
- අවස්ථානුකූල ව ප්‍රතිචාර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සුබ පැතීම සඳහා අදාළ භාෂා යෙදුම් හඳුනාගත යුතු බව.
- එම යෙදුම් අවස්ථානුකූල ව භාවිත කළ යුතු බව.
- ආචාරශීලී ව ඒවාට ප්‍රතිචාර දැක්විය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආදර්ශයක් මඟින් සුබ පැතීමේ යෙදුම් හඳුන්වා දෙන්න.
- සරල සංවාද මඟින් සුබ පැතීමේ ක්‍රම භාවිත කිරීමට සිසුන් යොමු කරවන්න.
- ආචාරශීලී ව ප්‍රතිචාර දැක්වීමට හුරු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය
- බ්‍රිස්ටල් බෝඩ්, මාකර් පෑන්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති අවස්ථාවට අනුව සුබ පැතුම තෝරයි / යා කරයි. / ප්‍රකාශ කරයි.
- අවස්ථාවට උචිත ලෙස සුබ පතයි.
- අවස්ථාවට උචිත ලෙස ප්‍රතිචාර දක්වයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.5 හැඟීම් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන හඳුනාගනියි.
- හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වන වාක්‍ය රටා හඳුනා ගනියි.
- හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන භාවිත කරයි.
- අවස්ථානුකුල ව හැඟීම් ප්‍රකාශ කරමින් භාෂණයේ යෙදෙයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සතුට, අසතුට, දුක, පුදුමය, එකඟතාව, විරුද්ධත්වය, කැමැත්ත, අකමැත්ත, කුසගින්න, පිපාසය, පාරිසරික වෙනස ප්‍රකට කිරීම සඳහා යෙදෙන වචන හඳුනාගත යුතු බව.
- අවස්ථානුකුල ව ඒවා භාවිත කළ යුතු බව.
- භාව ප්‍රකාශනය සිදු වන අයුරින් එම වචන භාවිත කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආදර්ශනය මගින් මෙම යෙදුම් හඳුන්වන්න.
- එම යෙදුම් භාවිතයට හුරු කරවන්න.
- පන්ති කාමරය තුළ එම යෙදුම් භාවිතයට සුදුසු අවස්ථා ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- චිත්‍ර සටහන්
- ශබ්දාවලී
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අවස්ථාවට උචිත හැඟීම් ප්‍රකාශ වන යෙදුම තෝරයි.
- අවස්ථාවට උචිත හැඟීම් ප්‍රකාශ වන යෙදුම කියවයි.
- හැඟීම් ප්‍රකාශන යොදා ගනිමින් අන්‍යයන් හා භාෂණයේ යෙදෙයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.6 ආචාරශීලීව ව කථා කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- ස්තුති කරයි.
- සමාව ගනියි.
- අවසර ගනියි.
- අවස්ථානුකූල ව ඔව් සහ නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ස්තුති කිරීම, සමාව ගැනීම, අවසර ගැනීම, ඔව්-නැත යනුවෙන් ප්‍රකාශ කිරීම සඳහා යෙදෙන භාෂා යෙදුම් හඳුනාගත යුතු බව.
- අවස්ථානුකූල ව ඒවා භාවිත කළ යුතු බව.
- භාව ප්‍රකාශනය සිදු වන පරිදි එම යෙදුම් භාවිත කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සංවාදයක් ඇසුරින් ඉහත යෙදුම් හඳුන්වා දෙන්න.
- යුගල වශයෙන් සංවාදයේ යොදවන්න.
- භාවිතය සඳහා සුදුසු අවස්ථාවක් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, සංවාද ඇතුළත් ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- යෝග්‍ය පරිදි ස්තුති කිරීම, සමාව ගැනීම සඳහා සුදුසු යෙදුම් තෝරයි.
- ඒවා යොදා ගනිමින් භාෂණයේ යෙදෙයි.
- ඔව් - නැත (जी हाँ, जी नहीं) යන්න අවස්ථානුකූල ව භාවිත කරයි.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | 6.0 | සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | 6.1 | නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍යය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි. |
| | (අ) | වචන භේදය |
| **කාලච්ඡේද** | 03 | |

**ඉගෙනුම් පල**

- ඒකවචන පදවල බහුවචන රූපය නිර්මාණය කරයි.
- බහුවචන පද ඒක වචනයට හරවා ලියයි.
- ඒකවචන බහුවචන නාමපද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඒකවචන නාමපදවල බහුවචනය නිර්මාණය කිරීමේ දී ලිංග භේදය සහ වචනාන්තය සැලකිල්ලට ගත යුතු බව.
- ඒකවචන නාමපද බහුවචනයට හැරවීමේ දී අදාළ වියරණ නීතිවලට අනුගත විය යුතු බව.

| පුරුෂ ලිංග | | ස්ත්‍රී ලිංග | |
|---|---|---|---|
| अध्यापक | अध्यापक | बहन | बहनें |
| लड़का | लड़के | माता | माताएँ |
| पिता | पिता | बहू | बहुएँ |
| मुनि | मुनि | वस्तु | वस्तुएँ |
| आदमी | आदमी | लड़की | लड़कियाँ |
| तराजु | तराजु | ध्वनि | ध्वनियाँ |
| डाकू | डाकू | चिड़िया | चिड़ियाँ |

- සම්මත වියරණ රීතිවලට පරිබාහිර ව ද ඒකවචන පදවල බහුවචන නිර්මාණය වන බව.
- සමූහාර්ථවාචී නාමපද යොදා ගනිමින් ද ඇතැම් ඒකවචන පදවල බහුවචන රූප නිර්මාණය කරගත හැකි බව. (अध्यापक गण, गुरु जन ආදි)
- බහුවචන ප්‍රත්‍යය ගැන්වීමේ දී ඇතැම් නාමපදවල රූපීය වෙනස්කම් සිදු වන බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඒකවචන නාමපද ලැයිස්තුවක් සිසුන්ට ලබා දෙන්න.
- එම නාමපද ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග වශයෙන් වර්ග කරවන්න.
- බහුවචන නාමපද නිර්මාණයට අදාළ නීති හඳුන්වා දෙන්න.
- සමූහාර්ථවාදී නාමපද හඳුන්වා දී ඒවා යොදා බහුවචන නිර්මාණය කර ගන්නා අයුරු පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඒකවචන සහ බහුවචන සහිත වචන ලැයිස්තුවක්, රූප සටහන්.

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නාමපද ඒකවචන සහ බහුවචන වශයෙන් බෙදා දක්වයි.
- ඒකවචන නාමපද බහුවචනයට හරවා ලියයි.
- බහුවචන නාමපදවලින් ඒකවචන නාමපද නිර්මාණය කරයි.
- සුදුසු පරිදි සමූහාර්ථවාචී නාමපද යොදා බහුවචන රූප නිර්මාණය කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1 නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍යය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

(ආ) නාම පද

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- හින්දී භාෂාවේ සියලු ම ප්‍රාණවාචී නාම පද ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග වශයෙන් බෙදා දක්වයි.
- සියලු ම අප්‍රාණවාචී නාම පද ද ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග වශයෙන් බෙදා දක්වයි.
- ලිංග නිර්ණය කිරීමේ රීති ඇති බවත් එම රීතිවලට පරිබාහිර අවස්ථා ද ඇති බව ප්‍රකාශ කරයි.
- පුරුෂ ලිංග නාම පදවල ස්ත්‍රී ලිංග රූපය නිර්මාණය කර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හින්දී භාෂාවේ ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග වශයෙන් ලිංග දෙකක් පමණක් ඇති බව
- අප්‍රාණවාචී නාම පද ද ස්ත්‍රී ලිංග පුරුෂ ලිංග වශයෙන් බෙදෙන බව
- අප්‍රාණවාචී නාම පදවල ලිංග නිර්ණය කිරීමේ රීති ඇති බවත් ඇතැම් අප්‍රාණවාචී නාම පද මෙම රීතිවලට පරිබාහිර ව යෙදෙන බව
- පුරුෂ ලිංග නාම පද ස්ත්‍රී වාචක ප්‍රත්‍ය එක් කිරීමෙන් ඒවායේ ස්ත්‍රී රූප නිර්මාණය කරගත හැකි බව
- ඇතැම් පුරුෂ ලිංග නාම පදවල විශේෂිත වූ ස්ත්‍රී ලිංග රූපයක් ඇති බව
- ඇතැම් ප්‍රාණවාචී නාම පදවලට ස්ත්‍රී ලිංග හෝ පුරුෂ ලිංග හෝ එක් රූපයක් පමණක් ඇති බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නාමපද ලැයිස්තුවක් සිසුන්ට ලබා දෙන්න. දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දී ප්‍රාණවාචී අප්‍රාණවාචී ලෙස වර්ග කිරීමට උපදෙස් දෙන්න.
- ප්‍රාණවාචී නාමපද ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග වශයෙන් වෙන් කර දැක්වීමට උපදෙස් දෙන්න.
- අප්‍රාණවාචී නාමපදවල ලිංග නිර්ණය කිරීමේ රීති පැහැදිලි කර දී ඒවා අනුව නාමපද වෙන් කිරීමට උපදෙස් දෙන්න.
- පුරුෂ ලිංග නාම පද ස්ත්‍රී වාචක ප්‍රත්‍යය ගන්වා ඒවායේ ස්ත්‍රී ලිංග රූප නිර්මාණය කරවන්න.
- පුරුෂ ලිංග පදයට ඉඳුරම වෙනස් වන ස්ත්‍රී ලිංග නාම පද හඳුන්වා දෙන්න.
- ස්ත්‍රී ලිංග හෝ පුරුෂ ලිංග හෝ එක් රූපයක් පමණක් ඇති නාම පද හඳුන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නාම පද ලැයිස්තු, හුනු පුවරු, රූප සටහන්, අන්තර්ජාල ප්‍රක්ෂේපණ යන්ත්‍ර

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නාම පද ප්‍රාණවාචී, අප්‍රාණවාචී ලෙස බෙදා දක්වයි.
- නාම පද ස්ත්‍රී ලිංග-පුරුෂ ලිංග ලෙස බෙදා දක්වයි.
- පුරුෂ ලිංග නාමපදවල ස්ත්‍රී ලිංග නාමපදය ලියයි.
- ස්ත්‍රී ලිංග නාමපදවල පුරුෂ ලිංග නාමපදය ලියයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1 නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍යය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

(ඇ) සර්ව නාම

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- සර්ව නාම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පුරුෂත්‍රය ට අනුව සර්ව නාම බෙදා දක්වයි.
- සර්ව නාම ඒක වචන, බහු වචන වශයෙන් බෙදා වෙන් කරයි.
- සර්ව නාම යොදා සරල වාක්‍ය ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සර්ව නාම පුරුෂත්‍රයය (උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, අන්‍ය පුරුෂ) අනුව බෙදෙන බව.
- සර්ව නාම යනු වෙනත් නාම පදයක් වෙනුවට යොදා ගන්නා නාම විශේෂයක් බව.
- සර්ව නාම ඒක වචන බහු වචන වශයෙන් වර්ගීකරණය කළ හැකි බව.
- යෙදෙන පරිසරය අනුව සර්ව නාමයේ ලිංග භේදය හඳුනාගත යුතු බව.
- වාක්‍ය නිර්මාණයේ දී සර්වනාමවලට අදාළ සරල සහායක ක්‍රියා යෙදිය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උදාහරණ ඇසුරින් සර්ව නාම හඳුන්වා දෙන්න.
- සර්ව නාම පුරුෂත්‍රයයට සහ වචන භේදයට අනුව වර්ගීකරණය කර දක්වන්න.
- සර්ව නාමවලට අදාළ සරල සහායක ක්‍රියා උදාහරණ ඇසුරින් පැහැදිලි කර දෙන්න.
- සර්ව නාම දැනුම වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සර්ව නාම සහ සහායක ක්‍රියා සහිත පුවරු
- අභ්‍යාස, ඡායා පිටපත්
- චිත්‍ර සටහන්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි සර්ව නාමය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
- සර්ව නාමයට අදාළ සහායක ක්‍රියාව තෝරයි.
- පුරුෂත්වයට අනුව සර්ව නාම වෙන් කර දක්වයි.
- සර්ව නාම යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1 නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍යය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි.

(ඈ) විශේෂණ පද

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- විශේෂණ පද යොදා නාමපද විස්තර කරයි.
- විශේෂණ පද යොදා ගනිමින් වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නාම පදයක විශේෂතා විස්තර කිරීම සඳහා විශේෂණ යොදා ගැනෙන බව.
- විශේෂණ පද විකාරී (आ ස්වරාන්ත) හා අවිකාරී වශයෙන් බෙදෙන බව.
- විකාරී විශේෂණ පද විශේෂ්‍යයේ ලිංග හා වචන භේදය අනුව වෙනස් වන බව.
- අවිකාරී විශේෂණ විශේෂ්‍ය අනුව වෙනස් නොවන බව.
- ඇතැම් आ ස්වරාන්ත විශේෂණ පද විශේෂ්‍ය අනුව වෙනස් නොවන බව (बढ़िया, ज़्यादा, घटिया)

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උදාහරණ ඇසුරින් විශේෂණ පද හඳුන්වා දෙන්න.
- විශේෂණ පද විකාරී - අවිකාරී වශයෙන් ප්‍රභේද 2ක් ඇති බව පැහැදිලි කර දෙන්න.
- आ ස්වරාන්ත පද බොහෝ විට විකාරී විශේෂණ වන බවත් විශේෂ්‍යයේ ලිංග භේදය හා වචන භේදය අනුව වෙනස් වන බව උදාහරණ ඇසුරින් අවබෝධ කර දෙන්න.
- आ ස්වරාන්ත නොවන විශේෂණ අවිකාරී විශේෂණ බව අවබෝධ කරවන්න.
- आ ස්වරාන්ත වුව ද ඇතැම් විශේෂණ පද අවිකාරී ලෙස යොදන ආකාරය පැහැදිලි කරන්න.
- විශේෂණ පිළිබඳ දැනුම තහවුරු කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වර්ණවත් චිත්‍ර සටහන්, විශේෂණ පද ඇතුළත් පුවරු, ශ්‍රව්‍ය-දෘශ්‍ය පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි විශේෂණ පදය තෝරයි.
- දී ඇති විශේෂණ පදයේ සුදුසු රූපය යොදා හිස්තැන් පුරවයි.
- විශේෂණ පද යොදා ගනිමින් වස්තූන් විස්තර කරයි.
- විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1 (ඉ) විභක්ති

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- හිස්තැනට සුදුසු විභක්ති ප්‍රත්‍යය යොදයි.
- නාමපද සමඟ විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.
- විශේෂණ සමඟ විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.
- විභක්ති පදවල අරුත් වටහාගෙන භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ने, को, से, का / के / की, में, पर යනුවෙන් විභක්ති ප්‍රත්‍යය ඇති බව.
- මේවා නාමපද සමඟ යෙදීමෙන් නාමපද විවිධාර්ථ ගන්නා බව.
- නාමපද සමඟ විභක්ති එක් වීමේ දී වචන භේදය හා ලිංග භේදය අනුව නාමපදයේ රූපීය වෙනස්කම් සිදු වන බව.
- සර්වනාම සමඟ විභක්ති එක්වීමේ දී සර්වනාමයේ රූපීය වෙනස්කම් සිදුවන බව.
- නාමපද සමඟ විභක්ති ප්‍රත්‍යය වෙන් කර ලිවිය යුතු බව.
- आ ස්වරාන්ත විශේෂණ පදයක් සමඟ යෙදෙන පුරුෂ ලිංග ඒකවචන නාමපදයකට පසු ව විභක්ති ප්‍රත්‍යය යෙදෙන විට විශේෂ්‍යය ද වෙනස් වන බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උදාහරණ ඇසුරින් විභක්ති ප්‍රත්‍යවල අර්ථය පැහැදිලි කරන්න.
- නාමපද සමඟ විභක්ති ප්‍රත්‍යය වෙන්වීමේ දී නාමපදයේ සිදුවන රූපීය වෙනස්කම් පැහැදිලි කර දෙන්න.
- සර්වනාම සමඟ විභක්ති ප්‍රත්‍යය එක්වීමේ දී සර්වනාමයේ සිදුවන රූපීය වෙනස්කම් වගුවක ආධාරයෙන් පැහැදිලි කරන්න.
- आ ස්වරාන්ත විශේෂණ පදයක් සමඟ යෙදෙන පුරුෂ ලිංග ඒක වචන නාමපදයකට පසු ව විභක්ති ප්‍රත්‍යය යෙදෙන විට විශේෂ්‍යය වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.
- හරි වැරදි ලකුණු කර වැරදි නිවැරදි කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විභක්ති ප්‍රත්‍යයවල අර්ථ ප්‍රකාශ වන චිත්‍ර සටහන්
- ස්ර්වනාම රූපාවලිය ඇතුළත් වගු
- ශ්‍රව්‍ය - දෘශ්‍ය හඬ පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි විභක්ති තෝරයි.
- විභක්ති ප්‍රත්‍යය භාවිත කරමින් චිත්‍ර සටහන් විස්තර කරයි.
- සර්වනාම සමඟ විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.
- විශේෂණ සමඟ විභක්ති ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.
- විභක්ති ප්‍රත්‍යය යොදා අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.2 (අ) විධි ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- හින්දී භාෂාවෙහි ආමන්ත්‍රණ විධි හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ආමන්ත්‍රණ විධි අනුව යෝග්‍ය විධානාඛ්‍යාත රූප හඳුනාගෙන යොදයි.
- විධානාර්ථ ප්‍රත්‍යය හඳුනාගෙන විධි ක්‍රියා නිර්මාණය කරයි.
- එකිනෙකාට විධාන දෙයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හින්දී භාෂාවේ तू, तुम, आप වශයෙන් ආමන්ත්‍රණ විධි 3ක් ඇති බව
- ආමන්ත්‍රණ විධි අනුව යෝග්‍ය විධානාඛ්‍යාත රූප යෙදිය යුතු බව.
- සම්මත හින්දී ව්‍යාකරණයට අනුව आप සමඟ ක්‍රියා මූලයට इए ප්‍රත්‍යයයත්, तुम සමඟ ක්‍රියා මූලයට ओ ප්‍රත්‍යයත්, යෙදෙන අතර तू සමඟ ක්‍රියා මූලය පමණක් භාවිත වන බව.
- මෙම විධානාඛ්‍යාත රූපවලට අමතර ව වෙනත් විධානාඛ්‍යාත රූප ද ඇති බව. (आना, आइएगा)
- හලන්ත ක්‍රියා මූල සමඟ ප්‍රත්‍යය සන්ධි කර ලිවිය යුතු බව හා ස්වරාන්ත ක්‍රියා මූල සමඟ ප්‍රත්‍යය එක් කර ලිවිය යුතු බව. (लिख + इए = लिखिए , जा + इए = जाइए)
- कर, ले, दे, पी යන ක්‍රියා මූලවල විශේෂ විධි ක්‍රියා රූප සෑදෙන බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ක්‍රියාකාරකම් අනුව ආමන්ත්‍රණ විධි හා විධානාඛ්‍යාත රූප හඳුන්වා දෙන්න.
- වගුවක ආධාරයෙන් විධි ක්‍රියා නිර්මාණය වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- වගුවක ආධාරයෙන් ආමන්ත්‍රණ විධි අනුව වෙනස් වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- कर, ले, दे, पी යන ක්‍රියාවල විශේෂිත විධි ක්‍රියා රූප වගුවක පැහැදිලි කරන්න.
- විකල්ප විධානාඛ්‍යාත රූප ද හඳුන්වා දෙන්න.
- සුදුසු ක්‍රියාකාරකම්වල යොදවන්න

**ගුණාත්මක යෙදවුම්**

- සංවාද ඇතුළත් ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍ය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- විධානාඛ්‍යාත රූප නිර්මාණය කරයි.
- සුදුසු විධානාඛ්‍යාත රූප තෝරයි.
- ආමන්ත්‍රණය විධි අනුව සුදුසු විධි ක්‍රියා රූපය ලියයි.

**නිපුණතාව** 6.0 සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.2 (ආ) සහායක ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- සහායක ක්‍රියා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- සහායක ක්‍රියාවල අර්ථය අවබෝධ කරගෙන භාවිත කරයි.
- සහායක ක්‍රියා සම්බන්ධයෙන් වියරණ නීති අවබෝධ කරගෙන වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- चाहिए, पड़ना යන සහායක ක්‍රියා සමඟ කර්තෘට විභක්තිය යෙදිය යුතු බව.
- ඉහත සහායක ක්‍රියා, ක්‍රියා නාමය සමඟ යෙදෙන බව.
- ඉහත සහායක ක්‍රියා යෙදෙන වාක්‍යවල කර්ම පදයක් යෙදී ඇති විට ක්‍රියා නාමය කර්ම පදය අනුව වෙනස් විය යුතු බව.
- सकना, चुकना යන සහායක ක්‍රියා යෙදෙන වාක්‍යවල කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු බව.
- ඉහත සහායක ක්‍රියා පද සැදෙන ක්‍රියා මූලය සමඟ යෙදිය යුතු බව.
- ඉහත සහායක ක්‍රියා පද දෙක අතීත කාල වාක්‍යවල යෙදෙන විට කර්තෘ සමඟ ने විභක්තිය නොයෙදිය යුතු බව.
- ක්‍රියා නාමයක් සමඟ लगना සහායක ක්‍රියාව යෙදෙන වාක්‍යවල කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු බව.
- එවිට ක්‍රියා නාමයේ ना අන්තය ने බවට පත් විය යුතු බව.
- හැඟීමක්, දැනීමක් ප්‍රකාශනයේ දී लगना යෙදිය හැකි බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උදාහරණ ඇසුරින් ඉහත සහායක ක්‍රියාවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- සුදුසු ඉගෙනුම් ආධාරක භාවිත කරමින් ඉහත සහායක ක්‍රියාව හා සම්බන්ධ වියරණ රීති පැහැදිලි කර දෙන්න.
- කේවල, යුගල හෝ කණ්ඩායම් හෝ වශයෙන් යෝග්‍ය ක්‍රියාකාරකම් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය, දෘශ්‍ය හඬ පට, ඡායා පිටපත්, අතිරේක කියවීම් පොත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සුදුසු සහායක ක්‍රියාව තෝරයි.
- ගැළපෙන සහායක ක්‍රියාව රූපය නිර්මාණය කරමින් යොදයි.
- සහායක ක්‍රියාවට ගැළපෙන ලෙස ප්‍රධාන ක්‍රියාව භාවිත කරයි.
- සහායක ක්‍රියා භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.2 (ඇ) ප්‍රේරණාර්ථක් ක්‍රියා (ප්‍රයෝජ්‍ය ක්‍රියාව) භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- ප්‍රේරණාර්ථක් ක්‍රියාව හඳුනා ගෙන විස්තර කරයි.
- ප්‍රේරණාර්ථක් ක්‍රියාව නිර්මාණය කරයි.
- ප්‍රේරණාර්ථක් ක්‍රියාව භාවිත කරමින් වාක්‍ය ගොඩනඟයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- प्रथम प्रेरणार्थक හා द्वितीय प्रेरणार्थक වශයෙන් ප්‍රේරණාර්ථක් ක්‍රියාවේ ප්‍රභේද දෙකක් ඇති බව.
- ප්‍රථම් ප්‍රේරණාර්ථක් ක්‍රියාව නිර්මාණයේ දී ක්‍රියා ධාතුව හලන්ත නම් आ ප්‍රත්‍යයය ද, ක්‍රියා ධාතුවෙහි පළමු වර්ණයෙහි දීර්ඝ ස්වරයක් වේ නම් ප්‍රත්‍යය එකතු වීමේ දී එය හ්‍රස්ව බවට ද පත් විය යුතු බව.
- ද්විතීය ප්‍රේරණාර්ථක් ක්‍රියාව නිර්මාණයේ දී ක්‍රියා ධාතුව හලන්ත නම් वा ප්‍රත්‍යය එක් වීම ද, ක්‍රියා ධාතුවේ පළමු වර්ණය දීර්ඝ ස්වරයක් නම් එය හ්‍රස්ව බවට පත් වීම ද සිදුවිය යුතු බව.
- දීර්ඝ ए ස්වරයෙන් අවසන් වන ක්‍රියා මූල इ බවට ද දීර්ඝ ओ ස්වරයෙන් අවසන් වන ක්‍රියා මූල उ බවට ද පත් විය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ප්‍රේරණාර්ථක් ක්‍රියා හඳුන්වා දෙන්න.
- ප්‍රේරණාර්ථක් ක්‍රියා නිර්මාණය පිළිබඳ රීති පැහැදිලි කර දෙන්න.
- ප්‍රේරණාර්ථක් ක්‍රියා රූප නිර්මාණය කරවන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම් මඟින් අභ්‍යාසයන්හි යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රේරණාර්ථක් ක්‍රියා දැක්වෙන වගු සටහන්, ශ්‍රව්‍ය දෘශ්‍ය පට, අතිරේක කියවීම්, අභ්‍යාස, ඡායා පිටපත්.

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ප්‍රේරණාර්ථක් ක්‍රියා නිර්මාණය කරයි.
- යෝග්‍ය ප්‍රේරණාර්ථක් රූපය තෝරයි.
- ප්‍රේරණාර්ථක් ක්‍රියා යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** 6.0 සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.3 වර්තමාන කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- වර්තමාන කාල ක්‍රියා නිර්මාණය කරයි.
- වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද අතර වෙනස හඳුනා ගෙන භාවිත කරයි.
- වර්තමාන කාල ක්‍රියා භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි. (ඇත/නැත/ප්‍රශ්නාර්ථය)

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියා නිර්මාණයේ දී ක්‍රියා මූලයට ता / ते / ती ප්‍රත්‍යය එක් කිරීමෙන් අනතුරු ව උක්තයට අනුව हूँ, हो, है, हैं යන සරල සහායක ක්‍රියා එක් කළ යුතු බව.
- තාත්කාලික් වර්තමාන කාල ක්‍රියා නිර්මාණයේ දී ක්‍රියා මූලයට रहा / रहे / रही එක් කිරීමෙන් අනතුරු ව වර්තමාන කාල සරල සහායක ක්‍රියා එක් කළ යුතු බව.
- සංදේහාත්මක් වර්තමාන කාල ක්‍රියා නිර්මාණයේ දී සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියාව සමඟ වාක්‍යයේ උක්තයට අනුව होना ක්‍රියාවේ අනාගත කාල රූප එක් කළ යුතු බව.
- ආභ්‍යාසික් වර්තමාන කාල ක්‍රියා නිර්මාණයේ දී සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියාව සමඟ रहना ක්‍රියාවේ වර්තමාන කාල ක්‍රියා රූප, වර්තමාන කාල සරල සහායක ක්‍රියා රූප එක් කළ යුතු බව.
- සාමාන්‍ය වර්තමාන කාල නිෂේධාර්ථයේ දී සරල සහායක ක්‍රියාව එක් නොකළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ක්‍රියා නාම හඳුන්වා දී එයින් ක්‍රියා මූලය හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කර දෙන්න.
- පියවර කිහිපයක් යටතේ (පාඩම් 4ක් මඟින්) එක් එක් කාල ප්‍රභේදවල දී ක්‍රියා මූලයට එක් වන ප්‍රත්‍යය සහ සරල සහායක ක්‍රියා පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් මඟින් වර්තමාන කාල ක්‍රියා නිර්මාණය කරවන්න.
- වර්තමාන කාල ක්‍රියා භාවිත කරමින් වාක්‍ය නිර්මාණයට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- චිත්‍ර සටහන්, සරල ඡේද, සංවාද, ශ්‍රව්‍ය දෘශ්‍ය පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- වර්තමාන කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.
- සුදුසු වර්තමාන කාල ක්‍රියා රූප තෝරයි.
- සුදුසු වර්තමාන කාල ක්‍රියා රූපය නිර්මාණය කර වාක්‍ය සම්පූර්ණ කරයි.
- වාක්‍ය නිෂේධාර්ථයට හරවා ලියයි, ප්‍රශ්නාර්ථ වාක්‍ය ගොඩනගයි.
- සරල සිදුවීම්, විස්තර කරයි, සංවාද ගොඩනගයි, වාක්‍ය රචනා ගොඩනගයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.4 අනාගත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 07

**ඉගෙනුම් පල**

- සරල භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.
- සාමාන්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.
- සම්භාව්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.
- අනාගත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන වාක්‍ය නිවැරදි ව ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සරල භවිෂ්‍ය ක්‍රියා රූප होगा, होगी, होंगे, होंगी වන බව.
- ක්‍රියා ධාතුවට ऊँगा / ओगे / एगा / एँगे / ऊँगी / ओगी / एगी / एँगी යන ප්‍රත්‍යය එක් කර පුරුෂත්‍රයයට අදාළ ව සාමාන්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කර ගත යුතු බව.
- ක්‍රියා ධාතුවට ऊँ, ओ, ए, एँ යන ප්‍රත්‍යය එක් කර පුරුෂත්‍රයයට අදාළ ව සම්භාව්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කර ගත යුතු බව.
- සම්භාව්‍ය භවිෂ්‍ය කාල රූප මඟින් අනුමතිය, ප්‍රාර්ථනා, සංශයාර්ථය සහ අසම්භාව්‍ය ආදි අර්ථ ප්‍රකාශ වන බව.
- සාමාන්‍ය භවිෂ්‍ය කාල ක්‍රියාරූපය ගොඩනඟයි.
- ගැළපෙන ක්‍රියා පදය තෝරයි.
- දී ඇති ක්‍රියා නාමය අනුව භවිෂ්‍ය කාල ක්‍රියාව නිර්මාණය කරමින් වාක්‍ය සම්පූර්ණ කරයි.
- භවිෂ්‍ය කාල ක්‍රියා භාවිත කරමින් සරල සංවාද, ලිපි රචනා නිර්මාණය කරයි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සුදුසු ඉගෙනුම් ආධාරකයක් ඇසුරින් අනාගත කාල ක්‍රියා රූප හඳුන්වා දෙන්න.
- එක් එක් කාලයට අනුව යෙදෙන ක්‍රියා ප්‍රත්‍යය හඳුන්වා දෙන්න.
- සිසුන් ලවා අනාගත කාල ක්‍රියා නිර්මාණය කරවන්න.
- අනාගත කාල ක්‍රියා නිර්මාණය කරමින් වාක්‍ය නිර්මාණයට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අනාගත කාල ක්‍රියා ප්‍රභේද දැක්වෙන වගු, ඡේද, සංවාද

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අනාගත කාල ක්‍රියා නිර්මාණය කරයි.
- සුදුසු අනාගත කාල ක්‍රියා රූපය තෝරයි.
- දී ඇති ක්‍රියා නාමය ඇසුරින් අනාගත කාල ක්‍රියා නිර්මාණය කරමින් වාක්‍ය සම්පූර්ණ කරයි.
- වර්තමාන කාල වාක්‍ය අනාගතයට හරවා ලියයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.5 අතීත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි.

**කාලච්ඡේද** 13

**ඉගෙනුම් පල**

- අතීත කාල සරල සහායක ක්‍රියා හඳුනා ගෙන භාවිත කරයි.
- අතීත කාල ක්‍රියා පද නිර්මාණය කරයි.
- ක්‍රියාවේ අකර්මක - සකර්මක භේදය හඳුනා ගෙන යොදයි.
- අතීත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන අදහස් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සරල අතීත කාලයේ දී වාක්‍යයේ උක්තයට අනුව था, थे, थी, थीं යන සහායක ක්‍රියා පමණක් යෙදෙන බව.
- තත්කාලික් භූත් කාලයේ දී ක්‍රියා මූලය සමඟ रहा, रहे, रही යන ක්‍රියා ප්‍රත්‍යය එක් වීමෙන් අනතුරු ව අතීත කාල සරල සහායක ක්‍රියා යෙදිය යුතු බව.
- ආභ්‍යාසික් භූත් කාලයේ දී සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියා සමඟ අතීත කාල සරල සහායක ක්‍රියා රූප යෙදිය යුතු බව.
- සමාපක් භූත් කාලයේ දී ක්‍රියා මූලය සමඟ चुका, चुके, चुकी, चुकीं යන සහායක ක්‍රියා යෙදිය යුතු බව.
- ඉහත සඳහන් අතීතකාල ප්‍රභේද 4 සමඟ ने විභක්ති ප්‍රත්‍යය නොයෙදෙන බව.
- සාමාන්‍ය අතීත කාල ක්‍රියාව නිර්මාණයේ දී හලන්ත ක්‍රියා මූලයට आ, ए, ई, ईं ප්‍රත්‍යත් හලන්ත නොවන ක්‍රියා මූලයට या, ये, यी, यीं ප්‍රත්‍යයත් එක් කළ යුතු බව.
- අතීත ක්‍රීයා රූප අතර අපවාද අවස්ථා ඇති බව. (करना, लेना, देना, पीना, जाना)
- සාමාන්‍ය අතීත කාල, පූර්ණ අතීත කාල ආසන්න අතීත කාල, සංදේහාත්මක අතීත කාල වාක්‍ය නිර්මාණයේ දි ක්‍රියාවේ අකර්මක - සකර්මක සැලකිල්ලට ගත යුතු බව.
- ක්‍රියාව සකර්මක නම් කර්තෘට ने ප්‍රත්‍යය එක් කළ යුතු බව.
- කර්තෘට ने ප්‍රත්‍යය යෙදී ඇති විට ආඛ්‍යාතය උක්ත කර්මයට අනුව තැබිය යුතු බව.
- ක්‍රියාව සකර්මක වුවත් කර්මය අනුක්ත වී ඇති නම් (को විභක්තිය) ආඛ්‍යාතය පුරුෂලිංග ඒක වචනයෙන් තැබිය යුතු බව.
- ක්‍රියාව සකර්මක වුව ද කර්මය සඳහන් නොවේ නම් ආඛ්‍යාතය පුරුෂ ලිංග, ඒකවචනයෙන් තැබිය යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අතීත කාල සරල සහායක ක්‍රියාව හඳුන්වා දෙන්න.
- සාමාන්‍ය අතීත කාල ක්‍රියාව නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න.
- පාඩම් 8ක් මඟින් එක් එක් අතීතකාල ප්‍රභේදයට අයත් විසරණ රීති පියවරින් පියවර හඳුන්වා දෙන්න.
- අතීත කාල ක්‍රියාවක අකර්මක-සකර්මක භේදය හඳුනා ගැනීම සම්බන්ධ ව විශේෂ අවධානයක් යොමු කරමින් ක්‍රියාකාරකම්වල යොදන්න.
- ने විභක්ති ප්‍රත්‍යයයේ භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරවන්න.
- අතීත කාල ප්‍රභේද අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල කතාන්දර ඡායා පිටපත්, සංවාද, පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සුදුසු අතීත කාල සහායක ක්‍රියාව තෝරයි.

**නිපුණතාව** 6.0 සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.6 හින්දී සංඛ්‍යාංකනය පිළිබඳ අවබෝධය ලබයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- 1-100 තෙක් ගණන සංඛ්‍යා හින්දියෙන් කියවයි.
- 1-100 තෙක් ගණන සංඛ්‍යා හින්දියෙන් ලියයි.
- අපූර්ණ සංඛ්‍යා හඳුනාගෙන කියයි, ලියා දක්වයි.
- ගුණවාචී සංඛ්‍යා හඳුනාගෙන භාවිත කරයි.
- යෝගවාචී සංඛ්‍යා හඳුනාගෙන භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- 0-09 තෙක් හින්දියෙන් ආවේණික වූ ඉලක්කම් ඇති බව.
- 1, 5, 8, 9 යන අංකවල වෙනත් රූප ද ඇති බව.
- $\frac{1}{4},\frac{1}{2},\frac{3}{4},1\frac{1}{4},1\frac{1}{2},2\frac{1}{2}$ වැනි අපූර්ණ සංඛ්‍යා සඳහා විශේෂ යෙදුම් ඇති බව.
- 1-7 තෙක් එනිකෙනට වෙනස් ක්‍රමවාචී සංඛ්‍යා ඇති බව.
- ගුණවාචී සංඛ්‍යා නිර්මාණය කර ගැනීමේ දී සංඛ්‍යාවට පසුව 'गुना' යන පදය එක් කළ යුතු බවත් 2, 3, 4 සංඛ්‍යා සඳහා විශේෂිත රූප ඇති බව. (दुगुना, तिगुना, चौगुना)
- යෝගවාචී සංඛ්‍යා නාම විශේෂණ ලෙස යෙදෙන බව. (प्रत्येक, हर, हरएक)
- බර, වේලාව, පරිමාණය, පරිමාව සහ මුදල් දැක්වීමේ දී අදාළ ඒකකය සුදුසු පරිදි භාවිත කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉගෙනුම් ආධාරක භාවිත කරමින් හින්දී සංඛ්‍යා රූප හඳුන්වා දෙන්න.
- ගුරුවරයා අනුකරණය කරමින් සිසුන්ට සංඛ්‍යා නාම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- හින්දී සංඛ්‍යා හා සංඛ්‍යා නාම ලිවීමට හුරු කරවන්න.
- අපූර්ණ සංඛ්‍යා නාම හඳුන්වා දී සුදුසු පරිදි භාවිත කරවන්න.
- ගුණවාචී සංඛ්‍යා නිර්මාණය කරවා සුදුසු අවස්ථාවල යෙදීමට උපදෙස් දෙන්න.
- යෝගවාචී සංඛ්‍යා හඳුන්වා දී ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අපූර්ණ හා පූර්ණ සංඛ්‍යා භාවිත කරමින් දුර, දිග, බර, වේලාව, පරිමාව, මුදල් වැනි මිනුම් ඒකක දැක්වීමට හුරු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංඛ්‍යා පුවරු
- හඬ පට
- වගු සටහන්
- චිත්‍ර සටහන්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති සංඛ්‍යා හින්දී ඉලක්කම්වලින් ලියයි.
- දී ඇති සංඛ්‍යා හින්දී වචනයෙන් ලියයි.
- හින්දී වචනයෙන් දී ඇති සංඛ්‍යා හින්දු අරාබි ඉලක්කම්වලින් ලියා දක්වයි.
- හින්දු අරාබි ඉලක්කම්වලින් දී ඇති සංඛ්‍යා හින්දී වචනයෙන් ලියයි.
- සුදුසු මිනුම් ඒකක භාවිත කරමින් හිස් තැන් පුරවයි.

**නිපුණතාව** 7.0 කියවා ප්‍රතිචාර දක්වයි

**නිපුණතා මට්ටම** 7.1 ශබ්ද නගා කියවයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- වචන නිවැරදි ව හා පැහැදිලි ව උච්චාරණය කරමින් කියවයි.
- විරාම ලකුණු සැලකිල්ලට ගෙන කියවයි.
- ව්‍යක්ත ලෙස කියවයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කියවීමේ දී වචන නිවැරදි ව හා පැහැදිලි ව උච්චාරණය කළ යුතු බව.
- කියවීමේ දී විරාම ලකුණු සැලකිල්ලට ගත යුතු බව.
- අර්ථාවබෝධ වන පරිදි කියවිය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සරල ගද්‍ය, පද්‍ය ඇතුළත් ඡායා පිටපත් ලබා දෙන්න.
- ගුරුවරයා ශබ්ද නඟා කියවා පෙන්වන්න.
- ගුරුවරයා අනුගමනය කරමින් කියවීමට උපදෙස් දෙන්න.
- කේවල වශයෙන් කියවීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අතිරේක ගද්‍ය, පද්‍ය පාඨ සහිත ඡායා පිටපත්, හඬ පට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සරල ගද්‍ය, පද්‍ය ශබ්ද නඟා කියවයි.
- වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- විරාම ලකුණු සැලකිල්ලට ගනියි.

**නිපුණතාව** 7.0 කියවා ප්‍රතිචාර දක්වයි

**නිපුණතා මට්ටම** 7.2 නිශ්ශබ්ද ව කියවා අර්ථය අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- දෙන ලද පාඨය නිශ්ශබ්ද ව කියවයි.
- දුරවබෝධ පදවල අර්ථය අසා දැන ගනියි.
- අර්ථය අවබෝධ කර ගෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දෙන ලද පාඨය නිශ්ශබ්ද ව කියවිය යුතු බව
- දුරවබෝධ පදවල අර්ථය අසා දැනගත යුතු බව
- අවබෝධයෙන් කියවා අර්ථය ග්‍රහණය කරගත යුතු බව
- පිළිතුර තම සරල හින්දී බසින් ලිවිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සරල ගද්‍ය, පද්‍ය පාඨ, සුබ පැතුම්පත්, කතාන්දර, ආරාධනා පත්‍ර, ලිපි, පණිවිඩ, යනාදිය සිසුන්ට ලබා දෙන්න.
- ඒවා නිශ්ශබ්ද ව කියවීමට උපදෙස් ලබා දෙන්න.
- දුරවබෝධ පදවල අරුත් පැහැදිලි කර දෙන්න.
- පිළිතුරු ලිවීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.
- හරි වැරදි ලකුණු කර වැරදි නිවැරදි කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල ගද්‍ය - පද්‍ය, කතාන්දර, ආරාධනා පත්‍ර, සුබ පැතුම් පත්, ලිපි, පණිවිඩ යනාදියේ පිටපත්, ශබ්ද කෝෂ

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ගද්‍ය - පද්‍ය පාඨ නිශ්ශබ්ද ව කියයි.
- දුරවබෝධ වචන අසා දැන ගනියි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව යොදයි.
- නිවැරදි වියරණය භාවිත කරයි.
- නිවැරදි පිළිතුර තෝරයි / යා කරයි/ ලකුණු කරයි.
- අසා ලියයි.

**නිපුණතාව** 8.0 පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 8.1 සරල හින්දී වාක්‍ය සිංහල /දෙමළ / ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- දී ඇති වාක්‍ය අදාළ කාලයට අනුව පරිවර්තනය කරයි.
- පරිවර්තිත භාෂාවේ ව්‍යාකරණ රීති අනුව පරිවර්තනය කරයි.
- පරිවර්තිත භාෂාවේ සම්ප්‍රදායය අනුව පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති වාක්‍ය පරිවර්තනයේ දී එහි අර්ථය අවබෝධ කර ගත යුතු බව.
- දි ඇති කාලයට අනුගත වෙමින් පරිවර්තනය කළ යුතු බව.
- පරිවර්තිත භාෂාවේ වාක්‍ය සම්ප්‍රදායය හා ව්‍යාකරණ රීති අනුගමනය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පරිවර්තනය සඳහා යෝග්‍ය සරල වාක්‍ය ලබා දෙන්න.
- පරිවර්තන රීතීන් පිළිබඳ දළ හැඳින්වීමක් කරන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම් හා අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල වාක්‍ය ඇතුළත් ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.
- නිවැරදි ව්‍යාකරණ රීති අනුව පරිවර්තනය කරයි.
- නිවැරදි ව්‍යාකරණ රීතී අනුව පරිවර්තනය කරයි.
- නිවැරදි සම්ප්‍රදායය අනුව පරිවර්තනය කරයි.

**නිපුණතාව** 8.0 පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 8.2 සරල හින්දී ගද්‍ය හා පද්‍ය පාඨ සිංහල /දෙමළ / ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- දී ඇති ගද්‍ය - පද්‍ය පාඨ කියවා අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.
- දී ඇති පද්‍ය පාඨයේ තාලයට අනුව පරිවර්තනය කරයි, පරිවර්තිත භාෂාවේ ව්‍යාකරණයට හා වාක්‍ය සම්ප්‍රදායය අනුව පරිවර්තනය කරයි.
- දී ඇති පද්‍යයේ භාවාර්ථය ලක්ෂ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පරිවර්තනයේදී දී ඇති ගද්‍ය - පද්‍ය පාඨය අවබෝධයෙන් යුතු ව කියවිය යුතු බව.
- පරිවර්තනයේදී දී ඇති ගද්‍ය - පද්‍ය පාඨය කාලය පිළිබඳ අවබෝධය යොමු කළ යුතු බව.
- පරිවර්තිත භාෂාවේ ව්‍යාකරණය හා වාක්‍ය ශෛලිය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව.
- පද්‍ය පරිවර්තනයේදී එහි භාවාර්ථය ප්‍රකාශ වන අයුරින් ප්‍රකාශ කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පරිවර්තනය සඳහා සුදුසු ගද්‍ය - පද්‍ය පාඨ සිසුන්ට ලබා දෙන්න.
- පරිවර්තනය සඳහා සුදුසු ගද්‍ය - පද්‍ය කියවා අර්ථය අවබෝධ කර ගැනීමට සලස්වන්න.
- දුරවබෝධ පද්‍යවල අර්ථ පැහැදිලි කර දෙන්න.
- පරිවර්තන රීති පිළිබඳ සැකෙවින් පහදා දෙන්න.
- පද්‍යවල භාවාර්ථය උකහාගෙන පරිවර්තනය කිරීමට උපදෙස් දෙන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල ගද්‍ය - පද්‍ය පාඨ, ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති සරල ගද්‍ය පාඨයේ අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.
- දී ඇති සරල ගද්‍ය පාඨයේ කාලයට අනුගත ව පරිවර්තනය කරයි.
- පරිවර්තිත භාෂාවේ ගද්‍ය පාඨයේ ව්‍යාකරණය හා සම්ප්‍රදායය අනුව පරිවර්තනය කරයි.
- පද්‍යවල භාවාර්ථය ප්‍රකාශ කරයි.

**නිපුණතාව** 8.0 පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 8.3 සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය හින්දී භාෂාවට පරිවර්තනය කරයි.

8.4 සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 16

**ඉගෙනුම් පල**

- දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය අවබෝධ කරගෙන හින්දී භාෂාවට පරිවර්තනය කරයි.
- සරල ගද්‍ය පාඨ අවබෝධ කරගෙන හින්දී භාෂාවට පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති ගද්‍ය පාඨය කියවා අවබෝධයෙන් යුතු ව කියවිය යුතු ය.
- දී ඇති ගද්‍ය පාඨයේ කාලයට අනුව පරිවර්තනය කළ යුතු බව.
- පරිවර්තිත භාෂාවේ ව්‍යාකරණයට අනුව පරිවර්තනය කළ යුතු බව.
- පරිවර්තිත භාෂාවේ ව්‍යාකරණය හා වාක්‍ය සම්ප්‍රදායය අනුව පරිවර්තනය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පරිවර්තනය සඳහා සුදුසු ගද්‍ය පාඨ ලබා දෙන්න.
- පරිවර්තනය සඳහා සුදුසු ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධයට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල සිංහල / දෙමළ / ඉංග්‍රීසි පද්‍ය පාඨ, ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති සිංහල / දෙමළ/ ඉංග්‍රීසි සරල වාක්‍ය ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.
- ව්‍යාකරණ රීති, කාලය, වාක්‍ය සම්ප්‍රදායය සැලකිල්ලට ගෙන හින්දියට පරිවර්තනය කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසයට අනුගත වෙමින් පරිවර්තනය කරයි.

**නිපුණතාව** 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම** 9.1 ගද්‍ය කියවා රසවිඳියි. චරිතායනය කරයි.

9.2 පද්‍ය කියවා රසවිඳියි. චරිතායනය කරයි.

**කාලච්ඡේද** 40

**ඉගෙනුම් පල**

- අදාළ ගද්‍ය - පද්‍ය කියවා අර්ථය ප්‍රකාශ කරයි.
- දුරවබෝධ පදවල අර්ථය ප්‍රකාශ කරයි.
- අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දක්වයි.
- ගද්‍ය - පද්‍ය පාඨවල අවස්ථා සම්බන්ධය දක්වයි.
- ගද්‍ය - පද්‍ය පාඨවලින් කියවෙන ආදර්ශය විස්තර කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අදාළ ගද්‍ය - පද්‍ය කොටස් කියවා අවබෝධ කර ගත යුතු බව.
- දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර ගත යුතු බව.
- අවබෝධයෙන් කියවා අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයිය යුතු බව.
- ගද්‍ය - පද්‍ය පාඨවල අවස්ථා සම්බන්ධය ස්මරණයේ තබා ගත යුතු බව.
- ගද්‍ය - පද්‍ය වලින් කියවෙන ආදර්ශය චරිතායනය කළ යුතු ය.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ගද්‍ය - පද්‍ය පාඨ නිහඬ ව කියවීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ පදවල අරුත් පැහැදිලි කර දෙන්න.
- ගද්‍ය - පද්‍ය පාඨවල ඇතුළත් විෂය කරුණු සාකච්ඡා කරන්න.
- ගද්‍ය - පද්‍ය පාඨවල අඩංගු ආදර්ශය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පෙළ පොත, ශබ්ද කෝෂ, අන්තර්ජාල, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය.

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අවබෝධයෙන් ප්‍රශ්නවලට පිළිතුරු ලියයි.
- අවස්ථා සම්බන්ධය ලියා දක්වයි.
- ගද්‍ය - පද්‍ය පාඨවල ඇතුළත් සමාන පද, විරුද්ධ පද, තනි වචන, රූඪී හා පිරුළු ලියා දක්වයි.
- භූමිකා රංගනයේ යෙදෙයි.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | 10.0 | නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. |
| **නිපුණතා මට්ටම** | 10.1 | නූතන හින්දී සාහිත්‍යයේ යුග නම් කරයි. |
| | 10.2 | නූතන හින්දී සාහිත්‍ය යුග පසුබිම විස්තර කරයි. |
| **කාලච්ඡේද** | 22 | |

**ඉගෙනුම් පල**

- නූතන හින්දී සාහිත්‍යයේ යුග නම් කරයි.
- නූතන හින්දී සාහිත්‍යයේ යුග පසුබිම් (ආර්ථික, සාමාජික, සංස්කෘතික) විස්තර කරයි.
- නූතන යුගයේ සාහිත්‍ය විශේෂතා විස්තර කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නූතන හින්දී සාහිත්‍ය යුග 4කට බෙදෙන බව.
- එක් එක් යුගයේ ප්‍රමුඛ සාහිත්‍යකරුවන් හා සාහිත්‍ය විශේෂතා සැලකිල්ලට ගෙන යුග නාමකරණය සිදු කර ඇති බව.
- ඒ ඒ යුගවල සාහිත්‍ය නිර්මාණ කෙරෙහි යුග පසුබිම සලකා ඇති බව.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- හින්දී සාහිත්‍යය සහ යුග බෙදීම පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඒ ඒ යුගවල යුග පසුබිම පිළිබඳ ව විස්තර කරන්න.
- ඒ ඒ යුගවල සාහිත්‍යයේ විශේෂතා පිළිබඳ විස්තර කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නූතන හින්දී සාහිත්‍ය යුග නම් කරයි.
- නූතන හින්දී සාහිත්‍ය පසුබිම විස්තර කරයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය : පළමු වන වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 3.2 , 3.3

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි.
   - සංයුක්ත ව්‍යංජන නිවැරදි ව ලියයි.
   - ශිරෝ රේඛාව නිවැරදි ව භාවිත කරයි.
   - හින්දී වචන නිවැරදි ව ලියයි
   - සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලියයි.

5. ආධාරකයේ ස්වභාවය :
   - ලිඛිත පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
   - ස්වර පිල්ලම් නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - සංයුක්ත අක්ෂර නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - හින්දී වචන නිවැරදි ව ලිවීමට හුරු කිරීම.
   - සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලිවීමට හුරු කිරීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස් :

*ගුරු භවතුන් සඳහා උපදෙස්*

- අල්පප්‍රාණ , මහාප්‍රාණ අක්ෂර , ස්වර පිල්ලම් සහ සංයුක්ත අක්ෂර සහිත සරල ගද්‍ය පාඨයක් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් සිසුන්ට ලබා දෙන්න.

- ඒ ඇසුරින් ස්වර පිල්ලම්, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර සහ සංයුක්ත අක්ෂර නිවැරදි ව භාවිත කරමින් වචන නිවැරදි ව ලිවීම, සරල වාක්‍ය නිවැරදි ව ලිවීම ආදිය තහවුරු වන පරිදි සිසුන් කේවල ව අභ්‍යාසවල නිරත කරවන්න.

*සිසුන් සඳහා උපදෙස්*

- දී ඇති උපදෙස් මැනවින් අනුගමනය කරමින් අභ්‍යාසයෙහි නිරත වන්න.

8. ඇගයීම් ක්‍රමය :

| සිසුන්ගේ නම් / නිර්ණායක | අල්පප්‍රාණ සහ මහාප්‍රාණ අක්ෂර , ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි | සංයුක්ත අක්ෂර නිවැරදි ව යොදයි | වචන නිවැරදි ව ලියයි | වාක්‍ය නිවැරදි ව ලියයි | කාල කළමනාකරණය | එකතුව |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳ යි - 04

හොඳ යි - 03

මධ්‍යස්ථ යි - 02

සංවර්ධනය විය යුතු යි - 01